වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுபகை அறிக்கை

Annual Performance Report







2021

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

திறன்கள் அபிவிருத்தி இ தொழிற்கல்வி இ ஆராய்ச்சி மற்றும் புத்தாக்க இராஜாங்க அமைச்சு

State Minisry of Skills Developmwnt, Vocational Education, Research and Innovation

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය - 421

අන්තර්ගතය

	පිටු අංකය
පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/විධායක සාරාංශය	01
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	13
පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	27
පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක	43
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	44
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ	46
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව	49

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ/විධායක සාරාංශය

2020.08.09 දිනැති අංක 2187/27 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයට අනුව නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය ක්‍රියාත්මක වෙයි.

1.1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සඳහා කර්මාන්ත හා සේවා අංශවල දායකත්වය ප්‍රමුඛ වන අතර ඒ සඳහා නිපුණතාවයෙන් සපිරි ශ්‍රම බලකායක් එක් කිරීම මෙම අමාත්‍යාංශයේ හා ඒ යටතේ ඇති ආයතනවල ප්‍රමුඛ කාර්යභාරය වේ. එබැවින් රටේ සමාජීය සහ ආර්ථික සංවර්ධනය උදා කර ගනු පිණිස වෘත්තීය පුහුණු අංශයේ අනාගත අභිවර්ධනය තීරණාත්මක සාධකයක් වනු ඇත. සීඝ්‍ර ලෙස නවීකරණයට ලක් වෙමින් පවතින දේශීය සහ විදේශීය කර්මාන්ත අංශයේ ශ්‍රම අවශ්‍යතා සපුරා ගනු පිණිස දක්ෂතා වලින් පරිපූර්ණ මෙන්ම ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් සහිත සහතිකපත්‍රලාභීන් බිහි කිරීමේ අභිලාෂයෙන් අතිගරු ජනාධිපතිතුමන් විසින් 2021-2030 " නිපුණතා දශකය" ලෙස නම් කරනු ලැබිණි. ඒ අනුව රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හරහා ශ්‍රම වෙළඳපොල වෙත වාර්ෂිකව එක්වන පුහුණුලාභීන් සංඛ්‍යාව ක්‍රමිකව වර්ධනය කිරීම සඳහා අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමටත්, 2025 වසර අග වන විට රැකියා ක්ෂේත්‍රයේ නුපුහුණු ශ්‍රම බලකාය 10% දක්වා පහත හෙලීම අරමුණු කර ගනිමින් ඔවුන් සඳහා විධිමත් පුහුණුවක් ලබා දීමේ නව ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමටත් මෙම රාජ්‍ය අමාත්‍යංශය විසින් පියවර ගනු ලැබේ.

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති රාමුව හා අනුගත වෙමින් නිපුණතාවෙන් සපිරි ශ්‍රම බලකායක් සහ පර්යේෂණ හා නවෝත්පාදන හරහා ජාතික ආර්ථිකය වැඩි දියුණු කිරීමේ වේදිකාවක් නිර්මාණය කරමින් නිපුණතා අධ්‍යාපනය හා නවෝත්පාදන සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම හා අදාළ වැඩසටහන් ගණනාවක් ඇතුලත් කරමින් 2021 වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලසුම ක්‍රියාත්මක කෙරිණි. කෙසේවුවද, පවතින සෞඛ්‍යමය ගැටලුකාරී වාතාවරණය හමුවේ එම වසර තුල දීර්ඝ කාලයක් මුළුල්ලේ පුහුණු මධ්‍යස්ථාන පාදක කර ගත් අධ්‍යාපන ක්‍රියාකාරකම් අඩපන වූ අතර ඒ හරහා වෘත්තීය අධ්‍යාපන ක්‍රියාකාරකම් ඇසුරෙන් අපේක්ෂා කරනු ලැබූ ඉලක්ක සපුරා ගැනීමට අපොහොසත්ව ඇත. අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක පුහුණු ආයතන ජාලය හරහා 2021 වසරේදී සිසුන් 159,059 ක් බඳවා ගැනීම අපේක්ෂා කෙරිණි. කෙසේවුවද, COVID- 19 වසංගත තත්ත්වය හේතුවෙන්, 2021 දෙසැම්බර් මස අග භාගය වනවිට සිසුන් ඇතුලත් කර ගැනීම් 70,444 ක් දක්වා සීමා වී පැවතුණි.

වසංගත තත්ත්වය හමුවේ වුවද, වෘත්තීය අධ්‍යාපන අංශය විසින් ද සිය කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාම උදෙසා ප්‍රතිඵලදායී විකල්ප මාර්ග අනුගමනය කරන ලදී. සෑම ආයතනයක්ම පුහුණු පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචිය මාර්ගගත ක්‍රමය යටතේ සිදුකරන ලද අතර පුහුණු පාඨමාලාවන්හි සිද්ධාන්තමය කරුණු මාර්ගගත ඉගැන්වීම් ක්‍රමය යටතේ සිදු කෙරිණි. මෙම ක්‍රියාවලිය පහසු කරවීම සඳහා ගුරුවරුන් සඳහා පුහුණුවක් ලබාදීමට කටයුතු කෙරිණි.

තවද, මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉගැන්වීම් කටයුතු කරන ලෙසත් අනෙකුත් පහසුකම් සංවර්ධනය කර ගැනීමටත් ආයතන සඳහා උපදෙස් ලබා දෙන ලදී. ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලයේ සහ වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ සිසුන් සඳහා ලැප්ටොප් පරිගණක මිලදී ගනු පිණිස මහජන බැංකුව හරහා ණය පහසුකම් ලබා දෙනු ලැබිණි. විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය හරහා පාඨමාලා කරුණු සන්නිවේදනය සඳහා පියවර ගනු ලැබ ඇති අතර රූපවාහිනී නාලිකා ඔස්සේ පුහුණු වැඩසටහන් පැවැත්වීම සුවිශේෂී අවස්ථාවක් විය. අධ්‍යාපනය ලබා දීමට අමතරව තක්සේරුකරුවන් සහ පරීක්ෂකයින් පුහුණු කිරීම සඳහා ද මෙම තාක්ෂණය අනුගමනය කෙරිණි.

පුහුණුව සඳහා ඇතුලත් කරගනු ලබන සිසුන් සංඛ්‍යාව දෙගුණ කිරීම පිණිස සමාජයේ සෑම කණ්ඩායමක්ම දැනුම්වත් කිරීමට සහ සිය පාසල් අධ්‍යාපනය අවසන් වීමෙන් පසු ඍජුව ඔවුන් වෘත්තීය පුහුණුව සඳහා යොමු කරවීමටත් අමාත්‍යාංශය විසින් පියවර ගන්නා ලදී. දිස්ත්‍රික් පරිපාලනයේ සෑම අංශයකම සහභාගීත්වය යටතේ ප්‍රකාශන එළි දැක්වීම් සහ රැකියා මාර්ගෝපදේශන ක්‍රියාකාරකම් සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

තරුණ කොටස්, නුපුහුණු වෘත්තිකයින් සහ සිය ක්ෂේත්‍රයන් පිලිබඳ දැනුම යාවත්කාලීන කර ගැනීමට අපේක්ෂා කරන සේවා නියුක්තිකයින් වැනි විවිධ කණ්ඩායම් සඳහා වෘත්තීය අධ්‍යාපන පහසුකම් සපයා දීම පිණිස වෘත්තීය පුහුණු ජාලය විධිමත් කරවීමට පියවර ගැනිණි. මේ සඳහා පෙර දැනුම ඇගැයීම් ක්‍රමවේදය (RPL), කර්මාන්තකරුවන් හරහා පුහුණුව ලබා දීම සහ නම්‍යශීලී ඉගෙනුම් ක්‍රමවේද ආදිය හඳුන්වා දී ඇත.

රැකියා අවස්ථා සහතික කිරීමේ උපාය මාර්ගයක් ලෙස කර්මාන්තයන් සමඟ ඒකාබද්ධව පුහුණු පාඨමාලා පැවැත්වීමටත් ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනයටත් පියවර ගන්නා ලදී.

ජාතික ආරක්ෂාව සහ උපායමාර්ගික වශයෙන් වැදගත් ක්ෂේත්‍රයන්හි තිරසර සංවර්ධනය සහතික කරමින් ශ්‍රී ලාංකීය ආර්ථිකය යළි ස්ථායී තත්ත්වය කරා මෙහෙයවනු පිණිස නවෝත්පාදක පර්යේෂණ සහ සංවර්ධන අංශයේ දායකත්වය ශ්‍රී ලංකාවට අත්‍යවශ්‍ය වේ. මෙම තත්ත්වය හඳුනාගනිමින් සිය අමාත්‍යාංශය වෙත වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන උපරිම ප්‍රතිඵලදායක අයුරින් ප්‍රයෝජනයට ගැනීමට මෙම රාජ්‍ය අමාත්‍යාංශය විසින් පියවර ගැනිණි.

ඒ අනුව සමාලෝචිත කාල සීමාව තුළ දී පර්යේෂණ සහ නවෝත්පාදන ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් ගණනාවක් ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය අමාත්‍යාංශය සමත් වී ඇති අතර යෝග්‍ය ක්‍රමවේද භාවිතයෙන් කාලීන වැදගත්කමකින් යුක්ත පර්යේෂණ තෝරා ගැනීම සහ එම පර්යේෂණ සඳහා ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන සපයා දීම, රටෙහි ආර්ථික වර්ධනය උදෙසා නිර්මාණශීලිත්වය සහ නවෝත්පාදනයන්හි ඇති වැදගත්කම පිලිබඳ මහජනතාව තුල ඇති දැනුම්වත්භාවය පුළුල් කරනු පිණිස විද්‍යාත්මක දැනුම බෙදාහැරීමේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නවෝත්පාදනයන් ප්‍රවර්ධනයට සහ වාණිජකරණය පුළුල් කිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සහ පවත්නා කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ විවිධ රටවල් සමඟ ජාත්‍යන්තර සහයෝගිතාවය ශක්තිමත් කිරීම සඳහා පියවර ගැනීම යනාදිය ඒ අතරට ගැනේ.

විද්‍යාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන්හි එක් අංගයක් ලෙස නොවැම්බර් 10 වෙනිදාට යෙදී ඇති ලෝක විද්‍යා දිනය හා සමගාමීව අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් ජාතික විද්‍යා දිනය සැමරීමේ උත්සවයක් අරලියගහ මන්දිරයේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කරනු ලැබූ අතර එහිදී "හීනවලට පණ දෙන වර්තමානය" යන තේමාව යටතේ "ජාතික නවෝත්පාදන මෙහෙයුම (NIM)" දියත් කරන ලදී.

සමාජයීය, විද්‍යාත්මක සහ තාක්ෂණික, ආරක්ෂණ, පාරිසරික සහ සේවා යන ක්ෂේත්‍රයන් හි නවෝත්පාදන පිලිබඳ මනා අවබෝධයක් නිර්මාණය කිරීම අරමුණු කර ගනිමින් 2019 අංක 22 දරණ පනත මඟින් ජාතික නවෝත්පාදන නියෝජිතායතනය (NIA) ස්ථාපනය කරනු ලැබ ඇති අතර රටෙහි ආර්ථිකය මත එම නවෝත්පාදනයන් හි බලපෑම පිලිබඳ සොයා බැලෙමින් පවතී.

'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති රාමුව යටතේ 'රජයේ කාබනික පොහොර වැඩසටහන්' හා සමගාමීව පේව පටල පේව පොහොර (BFBF) ව්‍යාපෘතිය අබණ්ඩව ක්‍රියාත්මක කෙරෙන අතර 2021 යල කන්නයේදී කුරුණෑගල, අම්පාර සහ පොළොන්නරුව ප්‍රදේශයන්හි අක්කර 55,000ක බිම් ප්‍රමාණයක් සඳහා විශේෂිතව පේව පොහොර (BFBF) යෙදීම සිදුවිය.

1.2. දැක්ම සහ මෙහෙවර

දැක්ම

නිපුණතාවයෙන් සපිරි පර්යේෂණශීලී නවෝත්පාදක සමාජයක්

මෙහෙවර

දැනුමෙන්, වෘත්තීය නිපුණතාවයෙන් සහ කුසලතාවයෙන් පිරි සුහුරු සමාජයක් බිහි කිරීම සහ පර්යේෂණ හා නවෝත්පාදන ප්‍රවර්ධනයට හිතකර පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම මගින් කලාපීය නව නිපැයුම් කේන්ද්‍රස්ථානයක් සඳහා පසුබිම සැකසීම

1.3. ප්‍රධාන කාර්යයන්

1. අධ්‍යාපන සුදුසුකම් නොසලකා තාක්ෂණය සහ වෘත්තීය අධ්‍යාපනය ලබා දීම.

2. සියළුම වෘත්තීය පුහුණු ආයතන ඇගයීමට ලක්කරමින් “One TVET” සංකල්පය යටතේ සියළුම වෘත්තීය ආයතන ජාලගත කිරීම.

3. ලංකා ජර්මානු තාක්ෂණික පුහුණු ආයතනය පුළුල් කිරීම.

4. ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් 7 කින් යුත් වර්තමාන ක්‍රමය මට්ටම් 10 දක්වා වැඩි කිරීම.

5. පශ්චාත් උපාධි මට්ටම දක්වා වෘත්තීය අධ්‍යාපනය හැදෑරීමට අධ්‍යාපන අවස්ථා ලබා දීම.

6. තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි සහ වෙනත් භාෂා ඇතුළත් කරමින් මෘදු කුසලතා සංවර්ධනය සඳහා විෂයමාලා සංශෝධනය කිරීම.

7. දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළ කෙරෙහි අවධානය යොමු කරන වෘත්තීය අධ්‍යාපනයක් ලබා දීමට පියවර ගැනීම.

8. තොරතුරු තාක්ෂණ ව්‍යවසායකත්වය ස්ථාපිත කිරීම.

9. පුරවර විශ්වවිද්‍යාල පිහිටුවීම.

10. අන්තර්ජාලය, කෘත්‍රිම බුද්ධිය, පෙව තාක්ෂණය, රොබෝ විද්‍යාව, Augmented Reality, Cloud Computing, නැනෝ තාක්ෂණය සහ ත්‍රිමාණ මුද්‍රණ භාවිතය උපරිම කිරීම මගින් ශ්‍රී ලංකාව නවෝත්පාදන මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත කිරීම.

11. පර්යේෂකයින්ගේ නවෝත්පාදන සහ පර්යේෂණ සඳහා පේටන්ට් බලපත්‍ර නිකුත් කිරීම සහ එම පර්යේෂණ සැලසුම් සඳහා හිමිකාරිත්වය ලබා ගැනීම සඳහා පද්ධතිය කාර්යක්ෂම කිරීම.

12. ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා දේශීය පර්යේෂණ ආයතන වලට පහසුකම් සැපයීම.

13. පර්යේෂණ සඳහා දායක වන පෞද්ගලික ව්‍යවසායන් සඳහා බදු සහන ලබා දීම.

14. නවෝත්පාදන නිෂ්පාදන වෙනුවෙන් දේශීය වෙළඳ නාමයක් යටතේ නිෂ්පාදනය සඳහා අවශ්‍ය දේශීය හෝ විදේශීය ආයෝජකයින් හඳුන්වා දීම.

15. නවෝත්පාදන හා පර්යේෂණ ප්‍රතිඵල ආයෝජකයින්ට සහ අදාළ පරිශීලකයින්ට ලබා දීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සකස් කිරීම.

1.4 සංවිධාන ව්‍යුහය

<u>පරිපාලන අංශය</u>



කාර්ය සම්පාදන අංශය



<u>වෘත්තීය පුහුණු අංශය</u>



<u>සංවර්ධන සහ නවෝත්පාදන අංශය</u>



පර්යේෂණ අංශය


ලේකම්
අධ්‍යක්ෂ ජනරාල්
(පර්යේෂණ)
අධ්‍යක්ෂ
(පර්යේෂණ)
සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ)
සංවර්ධන නිලධාරී (- -)
සහ
කළමනාකරණ සේවා නිලධාරී
(- -)
කාර්යාල සහායක (- -)

<u>ගිණුම් අංශය</u>


ලේකම්
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ප්‍රධාන ගණකාධිකාරී - I
ප්‍රධාන ගණකාධිකාරී - II
ගණකාධිකාරී - I
ගණකාධිකාරී - II
ගණකාධිකාරී - III
ගණකාධිකාරී - IV
සංවර්ධන නිලධාරී (- -)
සහ
කළමනාකරණ සේවා නිලධාරී
(- -)
කාර්යාල සහායක (- -)

සැලසුම් අංශය


ලේකම්
අධ්‍යක්ෂ ජනරාල්
(වෘත්තීය පුහුණු සහ නිපුණතා සංවර්ධන)
අධ්‍යක්ෂ ජනරාල්
(පර්යේෂණ හා නවෝත්පාදන)
අධ්‍යක්ෂ
(වෘත්තීය පුහුණු සහ නිපුණතා සංවර්ධන)
අධ්‍යක්ෂ
- I
(පර්යේෂණ හා නවෝත්පාදන)
අධ්‍යක්ෂ
-II
(පර්යේෂණ හා නවෝත්පාදන)
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ
සංවර්ධන නිලධාරී (- -)
සහ
කළමනාකරණ සේවා නිලධාරී
(- -)
සංවර්ධන නිලධාරී (- -)
සහ
කළමනාකරණ සේවා නිලධාරී
(- -)
කාර්යාල සහායක (- -)
කාර්යාල සහායක (- -)

අභ්‍යන්තර විගණන අංශය



ව්‍යාපෘති අංශය



1.5 රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

- කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව (DTET)

1.6 රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC)
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය (VTA)
- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (NAITA)
- ලංකා-ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය (CGTTI)
- වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය (UNIVOTEC)
- ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය (OUSL)
- ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය (NIBM)
- සී/ස ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය (NSBM)
- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය (SLIOP)
- නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය (ACCIMT)
- ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERDC)
- ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS)
- ජාතික පර්යේෂණ සභාව (NRC)
- ජාතික විද්‍යා පදනම (NSF)
- ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම (SLIC)
- ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම (මිලියන)	ව්‍යාපෘති කාල සීමාව
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ව්‍යාපෘතිය (GTZ)	ජර්මානු රජය	යූරෝ මිලියන 7	2019 ජූලි –2022 ජූනි
USAID යොවුන් රැකියා නියුක්ති හා නව ව්‍යාපාර ඇරඹුම් ව්‍යාපෘතිය (You Lead)	ඇමරිකා එක්සත් ජනපදය	ඇමරිකානු ඩොලර් මිලියන 18	2017 ජූනි 02 –2024 මැයි 31

02 පරිච්ඡේදය

ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

2.1. 2021 වසර තුල අමාත්‍යාංශය විසින් අත් කර ගනු ලැබ ඇති ප්‍රගතිය

2.1.1 නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන අංශය

ගරු අග්‍රාමාත්‍යතුමන් විසින් මුදල් අමාත්‍යවරයා ලෙස 2021 වසර සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබූ යෝජනා මත නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය වෙත රු. මිලියන 3000 ක අමතර ප්‍රතිපාදන ලබා දී ඇති අතර වෘත්තීය පුහුණුව සඳහා තරුණ කොටස් ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් "One TVET" සංකල්පය යටතේ වෘත්තීය පුහුණු ආයතන සවිමත් කිරීම මේ යටතේ අපේක්ෂා කෙරේ. අභ්‍යාසලාභීන් වෙත ශිෂ්‍යාධාර ලබා දීම, පුහුණුකරුවන් පුහුණු කිරීම, තාක්ෂණික උපකරණ මිලදී ගැනීම, ගොඩනැගිලි නඩත්තු කටයුතු සහ නවීකරණය කිරීම යනාදිය කඩිනමින් සිදු කිරීම සඳහා මෙම ප්‍රතිපාදන වෙන් කර දී ඇත.

ඒ අනුව, 2020 වසරේදී අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක පුහුණු මධ්‍යස්ථාන 80 ක පවත්නා සම්පත් පිලිබඳ තක්සේරුවක් සිදුකරන ලද අධ්‍යයනය ආශ්‍රයෙන් 2021 වසරේදී තොරතුරු විශ්ලේෂණය කරන ලදි. මෙමඟින් දැනට පවත්නා මධ්‍යස්ථානයන්හි අඩුපාඩු රැසක් හඳුනාගනු ලැබිණි. එමෙන්ම ග්‍රාමීය ප්‍රජාව අතර වෘත්තීය පුහුණුව පිලිබඳ ප්‍රචාරණ කටයුතු අවම මට්ටමක පැවතීම හේතුවෙන් ග්‍රාමීය ප්‍රදේශයන් හි වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සඳහා පුහුණු ලාභීන් ඇතුලත් වීම අවම මට්ටමක පවතින බවද මෙහිදී අනාවරණය විය. ඉහත කී අයවැය යෝජනාවට යටත්ව එම අවශ්‍යතා සහ අඩුපාඩු සපුරා ගනු පිණිස පහත සඳහන් කර ඇති විශේෂ වැඩසටහන් අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලදී.

- අඩු ඉල්ලුමක් පවතින පාඨමාලා සඳහා අභ්‍යාසලාභීන් දිරිමත් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක " නිපුණතා සිසු සවිය" ශිෂ්‍යාධාර වැඩසටහන යටතේ අදාළ නිර්ණායක හා අනුකූලත්වය දක්වමින් ආයතන 5 විසින් අභ්‍යාසලාභීන් 26,737 දෙනෙකු ශිෂ්‍යත්වලාභීන් ලෙස තෝරා ගනු ලැබිණි. අනෙකුත් ආයතන විසින් ශිෂ්‍යත්වලාභීන් තෝරා ගැනීම දැනට සිදු කෙරෙමින් පවතී. ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මෙම කාර්යය සඳහා රු.මිලියන 360 ක මුදලක් වෙන් කර දී ඇති අතර මේ දක්වා පුහුණු ආයතන වෙත රු. මිලියන 142.37 ක මුදලක් වෙන් කර දී ඇත.

- අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධන අරමුණින් කාර්යසාධනය පදනම් කරගනිමින් උපදේශකවරුන් සඳහා දීමනාවක් ලබාදීම සඳහා නිර්ණායක නිර්දේශ කරනු පිණිස කමිටුවක් පත් කරනු ලැබිණි. අදාළ නිර්දේශ, අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබූ අතර අදියර දෙකකින් ගෙවීම් කිරීම සඳහා එකඟතාවය හිමි වී ඇත. මාර්ගගත ඉගැන්වීම් ක්‍රමය පිලිබඳ උපදේශකවරුන් දැනුම්වත් කිරීම සඳහා පුහුණු සැසි පැවැත්වීමට කටයුතු කර ඇත.

- බඳවා ගනු ලබන සිසුන් සංඛ්‍යාව ඉහල නැංවීම අමාත්‍යාංශයේ එක් ප්‍රධාන අරමුණකි. ඒ අනුව, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් ඉගැන්වීම් ධාරිතාවන් වර්ධනය කරනු පිණිස අතිරේක බාහිර හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් කාර්ය මණ්ඩලය සඳහා දීමනා ලබා දීමේ අවශ්‍යතාව හඳුනා ගන්නා ලදී. නව බඳවා ගැනීම් සිදු කිරීම සඳහා කටයුතු කෙරෙමින් පවතී.

- වෘත්තීය පුහුණුව සඳහා තරුණ කොටස් ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් කාර්මික විද්‍යාල/ දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිලි වල පෙනුම වැඩි දියුණු කරනු පිණිස "ටෙක් උදාන" වැඩසටහන යටතේ සුවිශේෂී ගෘහ නිර්මාණ සැලසුමක් හා අනුකූලව සංවර්ධන කටයුතු ආරම්භ කෙරුණි. ඒ අනුව, 2021 වර්ෂයේදී වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 6 ක් වැඩි දියුණු කිරීමට කටයුතු කරන ලදී. අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලැබ හෝමාගම, කුරුණෑගල, මහනුවර සහ බදුල්ල කාර්මික විද්‍යාලයන් හි කටයුතු ආරම්භ කරනු ලැබීය. ශ්‍රී ලංකා නාවික හමුදාව යටතේ මාතර සහ මරදාන කාර්මික විද්‍යාලයන් හි සිවිල් ඉදි කිරීමේ කටයුතු සිදු කරන අතර නවීකරණ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී.

- රැකියා වෙළඳපොළෙහි ඉහල ඉල්ලුමක් පවතින පාඨමාලා සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම ඉහල නැංවීම අරමුණු කර ගනිමින් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයන් හි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන් හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට තීරණය කෙරුණි. පන්ති කාමර, වැඩ කුටි, විද්‍යාගාර, ආපනශාලා, විවේකාගාර, ඇඳුම් මාරු කිරීමේ කාමර, සනීපාරක්ෂක ඒකක සහ සිසුන්ගේ/ ගුරුවරුන්ගේ නිල නිවාසවල ප්‍රතිසංස්කරණ සහ වැඩි දියුණු කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර රු. මිලියන 481.80 ක මුදලක් වෙන් කරනු ලැබ ආයතන පහක් මඟින් යෝජනා කරනු ලැබූ මධ්‍යස්ථාන 38 ක ව්‍යාපෘති 82 ක කටයුතු ආරම්භ කරන ලදී.

- වෘත්තීය පුහුණු අංශයේ සිසුන් සඳහා ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතීන් හා අනුකූලව තාක්ෂණික දැනුම ලබා දෙනු පිණිස වැඩහල් සහ විද්‍යාගාර සඳහා පුහුණු උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර ලබා දීම සිදු කෙරේ. ආයතන 4 ක් සඳහා උපකරණ ලබා දෙනු පිණිස රු. මිලියන 218 ක මුදලක් වෙන් කරන ලදී. විදේශ ප්‍රදාන හරහා ප්‍රතිපාදන වෙන් කිරීම් අපේක්ෂා කරමින් ප්‍රමුඛතාව අනුව ලැයිස්තු ගත කරනු ලැබූ උපකරණ අවශ්‍යතා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.

- නව කලාපීය මධ්‍යස්ථාන ස්ථාපනය සඳහා ලද යෝජනා සලකා බැලෙමින් පවතින අතර ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් ශක්‍යතා අධ්‍යයනයන් සිදු කෙරෙමින් පවතී.

- ජංගම වෘත්තීය පුහුණු සහ ප්‍රවර්ධක ඒකක ස්ථාපනය හරහා වෘත්තීය අධ්‍යාපනය ප්‍රවර්ධනය සඳහා ක්‍රියාමාර්ග ගැනුනි. ඒ අනුව ජංගම විද්‍යාගාර බස් රථයක් හරහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබිණි.

- නිපුණතා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සහ ඒ පිලිබඳ දැනුම ලබා දීම අරමුණු කරගනිමින් "Skills Sri Lanka" නිල පුවත්පත් අතිරේකයේ සිංහල භාෂාමය අතිරේකය "දිනමිණ" පුවත්පත සමඟින් ද දමිළ භාෂාමය අතිරේකය "තිනකරන්" පුවත්පත සමඟින් ද පිළිවෙලින් මාර්තු සහ ජූලි මාස වලදී නිකුත් කෙරිණි. මෙයට අතිරේක වශයෙන් රූපවාහිනී සහ ගුවන්විදුලි ප්‍රවර්ධක වැඩසටහන් විකාශය කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබිණි.

නිපුණතා සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය

- "Skills Sri Lanka" තේමාව යටතේ 2021 වර්ෂය සඳහා නිපුණතා සංවර්ධන වැඩසටහන් දියත් කිරීම 2021 මාර්තු මස 2 දින අතිගරු ජනාධිපතිතුමන්ගේ ගරු අග්‍රාමාත්‍යතුමන්ගේ, අධ්‍යාපන අමාත්‍යතුමන්ගේ, ගරු රාජ්‍ය අමාත්‍යතුමියගේ සහ අමාත්‍යවරුන් පිරිසකගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී උත්සවාකාරයෙන් පැවැත්විණි. මෙහිදී "Skills Sri Lanka" ලාංඡනය එළි දැක්වීම, නව පුහුණු අවස්ථා සඳහා පෞද්ගලික අංශය සමඟ සහයෝගිතාවන්ට එළඹීම (Pizza Hut/ Orange/

Nursing School), සිසුන් සඳහා ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම, ප්‍රංගම පුහුණු ඒකක හඳුන්වා දීම සහ "Skills Sri Lanka" පුවත්පතෙහි පළමු කලාපය අතිගරු ජනාධිපතිතුමන් සහ ගරු අග්‍රාමාත්‍යතුමන් වෙත පිරිනැමීම සිදු කෙරිණි.

- ලෝක තරුණ නිපුණතා දිනය 2021
  පුරවර විශ්වවිද්‍යාල ස්ථාපනය යන තේමාව යටතේ මෙම වසරේ ලෝක තරුණ නිපුණතා දිනය සැමරීම අතිගරු ජනාධිපතිතුමන්, ගරු අග්‍රාමාත්‍යතුමන්, ගරු රාජ්‍ය අමාත්‍යතුමිය, ජනාධිපති ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් සහ පෞද්ගලික අංශයේ සම්පත් දායකයින්ගේ සහභාගිත්වයෙන් සිදු කෙරුණි. අතිගරු ජනාධිපතිතුමන් විසින් 2021.01.04 දිනැති අංක. 2209/14 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් මෙහි වගකීම නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරා දී ඇත. ඒ අනුව, " ලෝක තරුණ නිපුණතා දිනය" සැමරීම සහ පුරවර විශ්ව විද්‍යාල ලාංඡනය සහ නිල වෙබ් අඩවිය එළි දැක්වීම 2021.07.15 දින ජනාධිපති ලේකම් කාර්යාලයේදී සිදු කෙරිණි.

- සිය නිවෙස්වල සිටම පාඨමාලා හැදෑරීමේ පහසුකම් සිසුන් වෙත සපයා දෙනු පිණිස රූපවාහිනී නාලිකා ඔස්සේ තෝරාගත් වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් විකාශය කෙරිණි. පහත පරිදි දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය හරහා NVQ සහතික පත්‍ර ලබා ගැනීමේ අවස්ථාව මේ හරහා සැලසෙනු ඇත.
  - සිරස නාලිකාව හරහා වැඩසටහන් 03 ක්
  - දෙරණ නාලිකාව හරහා වැඩසටහන් 02 ක්

- පාසල් 382 ක් කේන්ද්‍ර කරගනිමින් "13 වසර අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන" හි සිව්වන පියවර ක්‍රියාත්මක කෙරිණි. මෙම වැඩසටහන යටතේ සිසුන් 11,985 ක් වෘත්තීය අධ්‍යාපනය සඳහා යොමු කිරීම සිදු කෙරිණි.

- ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව ලබන සිසුන් සඳහා SEPI ණය යෝජනා ක්‍රමය යටතේ රු. මිලියන 10 ක ණය ලබා දී ඇති අතර 2021.12.31 දින වන විට වියදම රු. මිලියන 5.85 ක් විය.

- ජනාධිපති කාර්යසාධන බලකාය හා එක්ව අඩු ආදායම්ලාභී පවුල් වල ප්‍රතිලාභීන් 100,000 සඳහා, ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීම් අධිකාරිය (NAITA) හරහා බහුකාර්ය සංවර්ධන කාර්ය බලකා පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීම. මේ යටතේ ප්‍රතිලාභීන් 34,000 දෙනෙකු සඳහා පුහුණුව ලබා දෙන ලදී.

- "GIZ ශ්‍රී ලංකාවේ වෘත්තීය අධ්‍යාපනය" ව්‍යාපෘතිය යටතේ ලැබී ඇති යූරෝ මිලියන 7 ක අරමුදල් යටතේ වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම/ ප්‍රවර්ධනය කිරීම සිදු කෙරෙමින් පවතී. කිලිනොච්චියේ ශ්‍රී ලංකා ජර්මානු කාර්මික පුහුණු ආයතනය (SLGTI) සහ තෝරා ගනු ලැබූ ජාතික වෘත්තීය පුහුණු ආයතන (NVTI) සඳහා පුහුණු ද්‍රව්‍ය සහ උපකරණ සපයා දෙනු පිණිස මෙම ප්‍රදාන යොදා ගනු ලැබිණි. මාතර කලාපීය මධ්‍යස්ථානය ස්ථාපනය කිරීමට නියමිත ඉඩම අමාත්‍යාංශය මඟින් අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත් අතර, ජර්මානු රජයේ ණය ප්‍රදානය කරනු ලබන ආයතනය වන KEW සමඟ ගිවිසුම් අත්සන් කරනු පිණිස නීතිපතිවරයාගේ අනුමැතිය සඳහා යොමු කරනු ලැබ ඇත. ජර්මානු රජය විසින් යූරෝ මිලියන 15.7 ක ණය ප්‍රදානයක් සඳහා ගිවිසුම්ගත වීමේ මූලික කටයුතු සිදු කරනු ලැබ ඇත.

- මට්ටක්කුලිය ප්‍රදේශයේ ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය (OUSL) සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම පිලිබඳ පරිසර ඇගයුම් වාර්තාව සකසමින් පවතී. 2022 වසරේදී මෙම ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරම්භ කෙරෙනු ඇත.

- ඕස්ට්‍රේලියා රජයේ ප්‍රදාන යටතේ ක්‍රියාත්මක S4IG ව්‍යාපෘතියේ දෙවන පියවර ලෙස ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 12 ක් ප්‍රදානයක් සඳහා අනුමැතිය ලබා ගනු පිණිස විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

- YOULEAD ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාල සීමාව තවත් වසර 3 කින් දීර්ඝ කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පියවර ගැනිණි. මේ හරහා වෘත්තීය පුහුණු අංශය සඳහා අතිරේක ප්‍රදානයක් ලෙස ඇමෙරිකානු ඩොලර් මිලියන 6 ක් ලැබෙනු ඇත.
- වෘත්තීය මාර්ගෝපදේශනය

  - පාසල් අධ්‍යාපනයෙන් පසු රැකියා වෙළඳපොල තුල සාඩම්බර සහ තෘප්තිමත් රැකියා සොයා ගැනීම සඳහා නිවැරදි මඟ පෙන්වීමක් ලබා දීමේ අරමුණින් "Find yourself YOU CAN Sri Lanka" යටතේ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් මාලාව ආරම්භ කර ඇත. මෙම මූලාරම්භය යටතේ පහත වැඩසටහන් පවත්වන ලදී.

    - අයි නාලිකාව හරහා 2021 සැප්තැම්බර් 27, 29 සහ ඔක්තෝබර් 01 දිනයන්හි දී වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම

    - අභියෝගවලට සාර්ථකව මුහුණ දී ඉන් ජය ලැබූ ව්‍යවසායකයින්ගේ දායකත්වය යටතේ සැප්තැම්බර් 27 සිට ඔක්තෝබර් 03 දක්වා දිනපතා පෙ.ව. 7.00 සිට පෙ.ව. 8.00 දක්වා, සිය නිපුණතා හඳුනා ගනිමින් සාර්ථක වෘත්තිකයෙකු බවට පත්වනු පිණිස තරුණ කොටස් වෙත මාර්ගෝපදේශකත්වය සැපයෙන වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන්, "වෙබිනාර්" මාර්ගගත පද්ධතිය හරහා පැවැත්වීම

    - නිපුණතා සංවර්ධන සහකාරවරුන්ගේ සම්පත් දායකත්වය යටතේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරමින් වෘත්තීය මාර්ගෝපදේශන සැසි පැවැත්වීම

  - "Find yourself YOU CAN Sri Lanka'' දියත් කිරීමේ නිල උත්සවය ගරු අධ්‍යාපන අමාත්‍යතුමන්ගේ ප්‍රධානත්වයෙන් 2021 සැප්තැම්බර් 30 දින පැවැත්විණි. මෙහිදී;

    - තරුණ තරුණයින් හට සෘජුව වෘත්තීය මාර්ගෝපදේශන විසඳුම් සොයා ගැනීමේ අවකාශ සලසා දෙමින් www.youthjobs.lk වෙබ් අඩවිය දියත් කිරීම

    - පරිවාස සහ ළමා ආරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන අනාථ නිවාසයන්හි ළමුන් සඳහා වෘත්තීය අධ්‍යාපනය ලබා දීම අරමුණු කර ගනිමින්, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය සහ ළමා සංවර්ධන, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල සහ පාසල් සේවා රාජ්‍ය අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී.

  - ජාතික වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන මධ්‍යස්ථානය වෙත වෘත්තීය මාර්ගෝපදේශකත්වය අපේක්ෂාවෙන් පැමිණෙන සියලුම පුද්ගලයින් සඳහා පෞද්ගලික වෘත්තීය මාර්ගෝපදේශන සැසි පැවැත්වීම. දුරකථන අංක 011- 2081808 හරහා ඔවුන් වෙත වෘත්තීය තොරතුරු සහ මාර්ගෝපදේශකත්වය ලබා දෙනු ලැබිණි.

- 2020 අ.පො.ස උ/පෙළ විභාගයේදී විශ්ව විද්‍යාල ප්‍රවේශ සුදුසුකම නොලැබූ සියලුම සිසුන් පිලිබඳ තොරතුරු විභාග දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගැනීමෙන් අනතුරුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට අනුයුක්තව සේවය කරන නිපුණතා සංවර්ධන සහකාරවරුන් සමඟ එම තොරතුරු බෙදා දෙනු ලැබූ අතර පෞද්ගලික වෘත්තීය මාර්ගෝපදේශන සහ දැනුම්වත් කිරීමේ සැසි පැවැත්වීම සඳහා සම්බන්ධීකරණය සිදු කරන ලදී.

- අප අමාත්‍යාංශය වෙත අලුතින් බඳවාගනු ලැබූ උපාධිලාභීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කිරීමට පෙර, දින 5 ක පුහුණු වැඩසටහනක් මධ්‍යස්ථාන තුලම පැවැත්වීම හරහා ඔවුන් වෙත වෘත්තීය මාර්ගෝපදේශනය පිලිබඳ මූලික දැනුම ලබා දීම.

2021 ජනවාරි 31 සිට සැප්තැම්බර් 30 දක්වා ජාතික වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන මධ්‍යස්ථානය විසින් පවත්වනු ලැබූ වැඩසටහන්

අනු අංකය	දිනය	ස්ථානය	වැඩසටහන	සහභාගී වූවන් සංඛ්‍යාව
01	2021.01.11	ටැංජරීන් බීච් හෝටලය - කළුතර	"Vocational Path for the Purpose of Learning" ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් සඳහා වූ පුහුණු වැඩසටහන - අධ්‍යාපන අමාත්‍යාංශය	90
02	2021.03.15	ආරක්ෂක සේවා විද්‍යායතනය- කොළඹ	15.03.2021 දින පවත්වනු ලැබූ බස්නාහිර පළාත තුල පාසල් ආරම්භ කිරීම පිලිබඳ ශිෂ්‍ය අභිප්‍රේරණ වැඩසටහන - 11 වසර - 5 වසර	 340 85
03	2021.04.28	ජාතික වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන මධ්‍යස්ථානය	අමාත්‍යාංශයේ කාර්යභාරය පිලිබඳ අලුතින් බඳවා ගනු ලැබූ සංවර්ධන නිලධාරීන් දැනුම්වත් කිරීමේ මාර්ගගත වැඩසටහන	12
04	2021.05.10	ආරක්ෂක සේවා විද්‍යායතනය - කොළඹ	අ.පො.ස. උ/පෙළ විෂය ධාරාවන් තෝරා ගැනීම සඳහා අ.පො.ස. සා/පෙළ සඳහා පෙනී සිටි සිසුන් සහ ඔවුන්ගේ දෙමාපියන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන මාර්ගගත වැඩසටහන	320
05	2021.05.25	ආරක්ෂක සේවා විද්‍යායතනය - කොළඹ	අ.පො.ස. උ/පෙළ ප්‍රතිඵල ලද සිසුන් සහ ඔවුන්ගේ දෙමාපියන් සඳහා වෘත්තීය පුහුණු පාඨමාලා පිලිබඳ දැනුම්වත් කිරීමේ මාර්ගගත වැඩසටහන	92
06	2021.06.28	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කළුතර	නව උපාධිලාභීන් සඳහා මනෝමිතික පරීක්ෂණය සහ තක්සේරුව පිලිබඳ හඳුන්වා දීමේ මාර්ගගත පරීක්ෂණය	28
07	2021.07.13	අධ්‍යාපන බල ප්‍රදේශය - කළුතර	10 වසර සිසුන් සඳහා විකල්ප විෂයයන් තෝරා ගැනීමේ මාර්ගගත වැඩසටහන	158
08	2021.05.10	ඥානෝදය	උසස් පෙළින් පසු හැදෑරිය හැකි	296

		විද්‍යාලය - කළුතර	වෘත්තීය පුහුණු පාඨමාලා පිලිබඳ වෘත්තීය මාර්ගෝපදේශන මාර්ගගත වැඩසටහන	
09	2021.08.11	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය	Future Chef වැඩසටහන - 2021 මෘදු කුසලතා සංවර්ධනය	සජීවී ෆෙස්බුක්, VTA යූ ටියුබ් නාලිකාව
10	2021.08.12	යොවුන් දිනය	Skills Update වෘත්තීය මාර්ගෝපදේශන 2021 වැඩසටහනෙහි වැදගත්කම	800 ක් වූ තරුණ පිරිසකගේ සහභාගීත්වයෙන් සජීවී ෆෙස්බුක් වැඩසටහන්

- ප්‍රතිලාභීන් 50,383 දෙනෙකු සඳහා වැඩසටහන් 2,808 ක් පහත තේමාවන් යටතේ පැවැත්වීම;
  - පාසල් හැර ගිය පුද්ගලයින් සඳහා වෘත්තීය පුහුණුව පිලිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන
  - පාසල් හැර ගිය පුද්ගලයින් වෘත්තීය පුහුණුව වෙත යොමු කිරීම සඳහා මාර්ගෝපදේශන වැඩසටහන
  - කර්මාන්ත අංශයේ රැකියා අවස්ථා පිලිබඳ සම්බන්ධීකරණ වැඩසටහන
  - පෙර දැනුම් ඇගයීමේ ක්‍රමවේදය (RPL) පිලිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන
  - RPL ක්‍රමවේදය අයදුම් කිරීම සඳහා යොමු කිරීම
  - රාජ්‍ය නිලධාරීන් සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන්
  - දෙමාපියන් සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන්
  - පාසල් සිසුන් සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් (අ.පො.ස. සා/පෙළ සහ අ.පො.ස. උ/ පෙළ)
  - ප්‍රායෝගික දෘඩාංග පිටපත් භාවිතයෙන් මනෝමිතික පරීක්ෂණ පැවැත්වීම
  - වෘත්තීය අධ්‍යාපනය පිලිබඳ වෙනත් දැනුම්වත් කිරීමේ වැඩසටහන්
  - වට්ස් ඇප්, වයිබර්, ඉමෝ, මෙසෙන්ජර්, ෆෙස්බුක්, ලයිව්, යූ ටියුබ්, සූම් ,වෙබිනාර් සහ වෙනත් මාර්ගගත ක්‍රමවේද ඇසුරෙන් වැඩසටහන් 600 ක් පවත්වනු ලැබූ අතර ඒ සඳහා 6100 කගේ සහභාගීත්වය හිමි විය.
- තෘතීය සහ කාර්මික අධ්‍යාපන සහ වෘත්තීය පුහුණු අංශය ඉහල නැංවීම අරමුණු කර ගනිමින් දිස්ත්‍රික් මෙහෙයුම් කමිටු යටතේ ප්‍රධාන කමිටු 5 ක් සහ අනු කමිටු 8 ක් ක්‍රියාත්මක කිරීම

2.1.2 පර්යේෂණ හා නවෝත්පාදන අංශය

- ජාතික නවෝත්පාදන නියෝජ්‍යාතනය (NIA) ස්ථාපනය කිරීම

සමාජ, විද්‍යා හා තාක්ෂණ, ආරක්ෂණ, පාරිසරික සහ සේවා යන ක්ෂේත්‍රයන්හි සිදු කෙරෙන නවෝත්පාදනයන් සහ රටෙහි ආර්ථිකය මත ඒවායේ බලපෑම පිලිබඳ මනා අවබෝධයක් ප්‍රවර්ධනය කිරීමේ විශේෂිත අරමුණ ඇතිව 2019 අංක 22 පනත යටතේ ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය (NIA) ස්ථාපනය කරනු ලැබිණි. 2021.03.08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය (COSTI) ජාතික නවෝත්පාදන නියෝජ්‍යාතනය වෙතට අන්තර්ග්‍රහණය කිරීම හරහා සහ COSTI සඳහා වෙන් කර දී ඇති අයවැය ප්‍රතිපාදන සහ එහි කාර්යමණ්ඩල සහ අනෙකුත් සම්පත් භාවිතයට ගනිමින් ජාතික නවෝත්පාදන නියෝජ්‍යාතනයෙහි කටයුතු ආරම්භ කිරීමට තීරණය කරනු ලැබිණි. ජාතික නවෝත්පාදන නියෝජ්‍යාතනයෙහි පළමු මෙහෙයුම් සභා රැස්වීම 2021 නොවැම්බර් 29 දින ජනාධිපති ලේකම්ගේ සභාපතිත්වය යටතේ පවත්වන ලදී.

- විද්‍යා සහ තාක්ෂණ ප්‍රචලිත කිරීමේ වැඩසටහන

❖ ජාතික විද්‍යා දිනය

2021 ජාතික විද්‍යා දිනය සහ ජාතික විද්‍යා සතිය සැමරීම සඳහා රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන සමඟ සහයෝගීතාවයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබිණි.

2021 ජාතික විද්‍යා දිනය සැමරීම අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේදී උත්සවාකාරයෙන් සිදුවූ අතර එහිදී "හීනවලට පණ දෙන වර්තමානය" යන තේමාව යටතේ "ජාතික නවෝත්පාදන මෙහෙයුම" (NIM) දියත් කරනු ලැබිණි. මෙම මෙහෙයුම යටතේ පාසල් සඳහා නවෝත්පාදන විද්‍යාගාර ජාලයක් ස්ථාපනය කිරීම සංකේතවත් කරමින් පළාත් නවයම ආවරණය කරමින් තෝරා ගත් පාසල් නවයක් සඳහා මූල්‍යමය ආධාර සහ උපකරණ ප්‍රදානය කිරීම සිදු විය. මෙයට අමතරව ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් සංවිධානය කරනු ලැබූ සහසක් නිමැවුම්- 2020 තරඟාවලියේ ජයග්‍රාහකයින්ට "දසිස් සම්මානය" ප්‍රදානය කිරීම ද ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය විසින් සංවර්ධනය කරනු ලැබූ ඉතා වැදගත්කමකින් යුතු සහ කාලීන වශයෙන් වටිනා උපකරණයක් වන ඔක්සිජන් සාන්ද්‍රකය (Oxygen Concentrator) එළි දැක්වීම ද සිදු කෙරිණි.

සතියේ එක් දිනයක් එක් විශේෂිත ප්‍රධාන තේමාවක් සඳහා වෙන් කිරීම හරහා ජාතික විද්‍යා සතිය- 2021 සංවිධානය කරනු ලැබිණි. ඒ අනුව නොවැම්බර් 10 - 16 දක්වා වූ සතියේ දින පිළිවෙලින් ජාතික විද්‍යා දිනය, නවෝත්පාදන දිනය, අභ්‍යවකාශ තාක්ෂණ දිනය, පේටන්ට් දිනය, බලශක්ති දිනය, නවෝත්පාදන ප්‍රවර්ධන දිනය සහ විද්‍යා ප්‍රවර්ධන දිනය ලෙස නම් කරනු ලැබිණි. එම දිනයන්හි දී ගරු කැබිනට් අමාත්‍යවරයාගේ, ගරු රාජ්‍ය අමාත්‍යවරයාගේ සහ එම ක්ෂේත්‍රයන්හි අනෙකුත් විධායක නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ප්‍රධාන තේමාගත වැඩසටහන් සහ ඒ හා සමගාමී වැඩසටහන් පවත්වනු ලැබිණි.

- ජාතික විද්‍යා දින සැමරුම් හා සමගාමීව ජාතික මූලික අධ්‍යයන ආයතනය හා සහයෝගීතාවයෙන් එදිනෙදා දිවිය සඳහා විද්‍යාව නමින් දීප ව්‍යාප්ත තරඟාවලියක් පැවැත්වීමට කටයුතු කරනු ලැබිණි.

  මෙම තරඟාවලිය පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වූයේ පාසල් ප්‍රජාව තුල විද්‍යාත්මක සංකල්ප ප්‍රවර්ධනය කරවීමත් විද්‍යාව පිලිබඳ ඔවුන් තුල පවතින විමසා බැලීමේ මානසිකත්වය වර්ධනය කරවීමත් සමඟ අපගේ වටපිටාව තුල පවත්නා විද්‍යාව පිලිබඳව කුතුහලයක් ඔවුන් තුල ජනිත කරවීමත්ය. මෙම තරඟාවලියේ ජයග්‍රාහකයින් සැමරීම 2021 ජාතික විද්‍යා සතිය හා සමගාමී වැඩසටහනක් ලෙස 21.11.15 දින ජාතික මූලික අධ්‍යයන ආයතන පරිශ්‍රයේදී සාර්ථකව පවත්වනු ලැබිණි. මෙම උත්සවයේදී සම්මානලාභීන් 156 දෙනෙකු (කුසලතා සහතික ලාභීන්ද ඇතුළුව), හොඳම අධ්‍යාපන කලාපය සහ හොඳම පාසල සඳහා සම්මාන හිමි විණි. මෙයට අමතරව මාර්ගෝපදේශයන්ට අනුකූලව ග්‍රන්ථ ඉදිරිපත් කරනු ලැබූ සියලුම සිසුන් සඳහා සහභාගීත්ව සහතිකයක් ප්‍රදානය කෙරිණි. හොඳම සංකල්ප ඇතුලත් කර සකසන ලද කුඩා පොත් පිංචක් ඔවුන් අතර බෙදා දෙන ලදී.

- විද්‍යා ඊ - පුවත් වෙබ් අඩවිය ආරම්භ කිරීම සහ වැඩි දියුණු කිරීම

  මෙම අමාත්‍යාංශය විසින් පෙර දී පළ කරනු ලැබූ විද්‍යා පුවත්පත සඳහා වඩා තාක්ෂණික මුහුණුවරක් ලබා දීම අරමුණු කර ගනිමින් මෙම වෙබ් අඩවිය නිර්මාණය කරනු ලැබූ අතර මේ වනවිට වෙබ් අඩවිය සංවර්ධන කිරීමේ කටයුතු වලින් 75% ක ප්‍රමාණයක් අවසන් කරනු ලැබ ඇත. මෙයට අමතරව, වෙබ් අඩවියෙහි පල කරනු පිණිස ලිපි එකතු කරන ලෙසට අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්වයන් වෙත දැනුම් දී ඇති අතර මේ වන විට ලිපි ලැබෙමින් පවතී.

- Skills Sri Lanka පුවත්පතෙහි ලිපි පල කිරීම

  Skills Sri Lanka පුවත්පත් අතිරේකය සඳහා විද්‍යා, පර්යේෂණ සහ නවෝත්පාදන අංශය හා අදාළ ලිපි 08 ක් ලබා දෙන ලදී.

- ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුව ක්‍රියාත්මක කිරීම (NRDF)

  - පර්යේෂණ සහ නවෝත්පාදන සංවර්ධනය ඉලක්ක කර ගනිමින් අදාළ පාර්ශ්වයන් අතර දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම

    දේශීය නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් උතුරු මැද, ඌව, බස්නාහිර, මධ්‍යම සහ දකුණු පළාත් හි නිපුණතා සංවර්ධන සහකාර සහ සංවර්ධන නිලධාරීන් ඉලක්ක කරගනිමින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමෙහි සහයෝගීතාවයෙන් පුහුණු වැඩසටහන් පවත්වනු ලැබිණි.

  - ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් පවත්වනු ලැබූ "වාර්ෂික පර්යේෂණ සමාලෝචනය-2020" සඳහා දායකත්වය දැක්වීම

    වාර්ෂික පර්යේෂණ සමාලෝචනය හරහා 2020 වසර තුලදී තමන් විසින් සිදු කරනු ලැබූ කාර්යයන්හි උසස් තත්ත්වය ප්‍රදර්ශනය කර පෙන්වීමේ සහ ශ්‍රී ලාංකීය පුරවැසියන් වෙත ඒ හරහා ඇති කිරීමට සමත් වූ බලපෑම ඉස්මතු කර පෙන්වීමේ අවස්ථාව විද්‍යාඥයින් වෙත උදා වේ. මෙය මහනුවර ජාතික මූලික අධ්‍යයන ආයතනයේ මහාචාර්ය සිරිල් පොන්නම්පෙරුම ශ්‍රවණාගාරයේදී 2021 අප්‍රේල් 6 දින පැවැත්විණි. ඒ අනුව , සේවා සම්මාන 01 ක් සහ විද්‍යුත් මාධ්‍යයෙහි විවෘත විද්‍යා කවය සඳහා සම්මාන 03 ක් වශයෙන් 2020 වසර සඳහා හොඳම පර්යේෂකයින් 04 දෙනෙකු තෝරා ගනු ලැබිණි.

  - ජාතික මූලික අධ්‍යයන ආයතනයේ තරුණ විද්‍යාඥයින්ගේ සංගමය (YSA-NIFS) විසින් සංවිධානය කරනු ලැබූ Three Minute Thesis (3MT) තරඟාවලිය 2021

    YSA- NIFS විසින් තෙවෙනි වරට සංවිධානය කරනු ලැබූ මෙම තරඟාවලිය හරහා ජාතික මූලික අධ්‍යයන ආයතනයේ උපාධි අපේක්ෂක ශිෂ්‍යයින් හට විනාඩි තුනක කාලයක් තුල සිය පර්යේෂණ විශේෂඥ නොවන ප්‍රේක්ෂක පිරිසක් වෙත සවිස්තරාත්මක අයුරින් ඉදිරිපත් කිරීම සඳහා වේදිකාවක් නිර්මාණය කර දීම සිදුවේ. තවද ඔවුන්ගේ වෘත්තීමය දිවිය සඳහා මහත් සේ වැදගත් වන ඉදිරිපත් කිරීමේ කුසලතා වැඩි දියුණු කිරීමටත්, විද්‍යාත්මක නොවන ප්‍රේක්ෂක පිරිසක් සඳහා යෝග්‍ය භාෂාවකින් විද්‍යාව පිලිබඳ කරුණු සන්නිවේදනය කිරීමේ හැකියා වැඩි දියුණු කිරීමත් මේ හරහා අරමුණු කෙරේ. මෙම මූලාරම්භයෙහි ඇති විද්‍යාත්මක වටිනාකම සැලකිල්ලට ගනිමින් මෙම වැඩසටහන සඳහා අමාත්‍යාංශයේ මූල්‍යමය දායකත්වය හිමිවිණි.

- පර්යේෂණ සහ නවෝත්පාදන සඳහා පහසුකම් සැපයීම

  ❖ පර්යේෂණ ව්‍යාපෘති සමාලෝචනය සඳහා "පර්යේෂණ කළමනාකරණ පද්ධතිය"ආරම්භ කිරීම

  අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන විසින් සිදු කරනු ලබන සියලු පර්යේෂණ, අධීක්ෂණය සහ සමාලෝචනය සහ පර්යේෂණ කළමනාකරණ පද්ධතියක් ආරම්භ කිරීම සඳහා සංකල්ප පත්‍රිකාවක් වැඩි දියුණු කරනු ලැබිණි. දත්ත කළමනාකරණ පද්ධතියක් පෙළ ගැස්වීම සඳහා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන විසින් අනුගමනය කල හැකි යාන්ත්‍රණයක් පිලිබඳ සොයා බැලීම සඳහා අදාළ ආයතන (උදා. NSF, NRC, NIFS, COSTI) සමඟ සාකච්ඡා පවත්වනු ලැබිණි.

  ❖ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන මඟින් ඉදිරිපත් කෙරෙන පර්යේෂණ ව්‍යාපෘති සමාලෝචනය

  මේ සඳහා යාන්ත්‍රණයක් යෝජනා කරනු ලැබ ඇත. පර්යේෂණ ආයතන විසින් හඳුනාගනු ලැබ ඇති පර්යේෂණ යෝජනා ඇගැයීම සඳහා ඇගයුම් කමිටුවක් පත් කරනු ලැබ ඇත. මෙම කමිටුව විසින් තෝරා ගනු ලැබූ පර්යේෂණ , ඒවායේ යෝජිත අරමුණු අත්කර ගනු ලබන තෙක් වරින් වර ඇගයීමට ලක් කෙරෙනු ඇත. රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඒ යටතේ ක්‍රියාත්මක පර්යේෂණ ආයතන විසින් 2022 වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති යෝජිත ව්‍යාපෘති නිරීක්ෂණයට ලක් කෙරෙනු ඇත.

  ❖ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2014 හා අනුකූලව පර්යේෂණ දීමනා ගෙවීම් කිරීම සඳහා පර්යේෂණ ව්‍යාපෘති සමාලෝචනය

  කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2014 හා අනුකූලව පර්යේෂණ දීමනා ගෙවීම් කිරීම සඳහා අමාත්‍යාංශය වෙත ලැබුණු පර්යේෂණ යෝජනා 09 ක්, අතුරු වාර්තා 09 ක් සහ අවසන් වාර්තා 04 ක් පර්යේෂණ කළමනාකරණ කමිටුව විසින් ඇගැයීමට ලක් කෙරිණි.

- ජාත්‍යන්තර සහයෝගිතාවන්

  ❖ ඉන්දු-ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන

  මෙම සහයෝගිතාවයෙහි දෙවෙනි අදියර 2017 වසරේ දී ආරම්භ වූ අතර 2021 වසර අවසන් වන විට පර්යේෂණ ව්‍යාපෘති 17 ක් සඳහා මූල්‍ය පහසුකම් සපයනු ලැබ පර්යේෂණ ව්‍යාපෘති 08 ක් සාර්ථකව අවසන් කරනු ලැබ ඇත. COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන් පැන නැගි දුෂ්කරතා මත ඉතිරි ව්‍යාපෘති නවයෙහි කටයුතු තවදුරටත් සිදු කෙරෙමින් පවතී. 2021 වසරේ දී සියලුම පර්යේෂණ ව්‍යාපෘතීන් ඇසුරෙන් විද්‍යාත්මක ප්‍රකාශන 43 ක් පළ කරනු ලැබ ඇත. මෙම සහයෝගිතාවයෙහි තෙවෙනි අදියර 2019 වසරේදී ආරම්භ කරනු ලැබිණි. පර්යේෂණ යෝජනා 178 ක් ඇගැයීමට ලක් කිරීමෙන් අනතුරුව පර්යේෂණ ව්‍යාපෘති 09 ක් සහ වැඩමුළු 03 ක් තෝරා ගනු ලැබූ අතර වැඩමුළු යෝජනා 14 ක් සහ එම පර්යේෂණ ව්‍යාපෘති සහ වැඩමුළු අමාත්‍යංශයේ පර්යේෂණ අංශය වෙත භාර දෙනු ලැබ ඇත.

  ❖ න්‍යෂ්ටික පර්යේෂණ පිලිබඳ යුරෝපා සංවිධානයෙහි (CERN) අධි ශක්ති භෞතික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධි

  න්‍යෂ්ටික පර්යේෂණ පිලිබඳ යුරෝපා සංවිධානය (CERN) විසින් ශ්‍රී ලංකාව සඳහා අධිශිෂ්‍යත්ව පිරිනැමීමේ අරමුණින් අධි ශක්ති භෞතික විද්‍යා ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධි වැඩසටහනක් ආරම්භ කරන ලදි. CERN හි සිය අධ්‍යයන කටයුතු වල නිරත වී සිටින ශ්‍රී ලාංකීය විද්‍යාඥයින් විසින් 2021 වර්ෂය තුලදී විද්‍යාත්මක ප්‍රකාශන 72 ක් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. උසස් පෙළ භෞතික විද්‍යා ගුරුවරුන් සඳහා අංශු භෞතික විද්‍යාව පිලිබඳ දීප ව්‍යාප්ත ගුරු පුහුණු වෙබිනාර් වැඩසටහනක්

ආරම්භ කරනු ලැබූ අතර බස්නාහිර, නැගෙනහිර, උතුරු, දකුණු සහ සබරගමුව යන පලාත්වල ගුරුවරුන් සඳහා එම වැඩසටහන් පවත්වනු ලැබිණි. උසස් පෙළ සිසුන් සහ ගුරුවරුන් සඳහා අංශු භෞතික විද්‍යාව පිලිබඳ වීඩියෝ සකසනු ලැබ ඇත. ශ්‍රී ලාංකික පර්යේෂකයින් කණ්ඩායමක් විසින් ද CERN සංවිධානය පිලිබඳ වීඩියෝවක් නිර්මාණය කරනු ලැබ ඇත.

❖ ශ්‍රී ලංකාව තුළ ක්‍රිසොටයිල් ඇස්බැස්ටෝස් හි ආරක්ෂිත භාවිතය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම

ශ්‍රී ලංකාව තුල ක්‍රිසොටයිල් ඇස්බැස්ටෝස් හි භාවිතය පිලිබඳ අවබෝධයක් ලබා ගනු පිණිස අමාත්‍යාංශය සහ රුසියාවේ යූරල් වාණිජ මණ්ඩලය අතර ඇති කර ගනු ලැබූ සහයෝගිතාවයන් හි ප්‍රතිඵලයක් ලෙස, රුසියානු හා ශ්‍රී ලාංකීය නියෝජිතයින්ගෙන් සැදුම්ලත් ක්‍රියාකාරී කණ්ඩායමක් පත් කරනු ලැබිණි. ශ්‍රී ලංකාවේ සහ රුසියාවේ ක්‍රියාකාරී කණ්ඩායම් දෙකෙහි ඉල්ලීම මත, කර්මාන්තයන්හි හා ඉදිකිරීම් වැඩබිම්හි මෙන්ම අවසන් පාරිභෝගික මට්ටම් දක්වා ඇස්බැස්ටස් භාවිතයෙහි හිතකර සහ අහිතකර තත්ත්වයන් පිළිබඳ පර්යේෂණ කණ්ඩායම් 4 ක් විසින් සොයා බලනු ලැබේ.

මෙම පර්යේෂණයන්හි ප්‍රගතිය පිලිබඳ සාකච්ඡා කරනු පිණිස මෙම ක්‍රියාකාරී කණ්ඩායමේ 8 වන හමුව 2021 අප්‍රේල් 10 -24 දක්වා ශ්‍රී ලංකාවේ කොළඹ දී පවත්වනු ලැබිණි.

❖ අත්සන් තබන ලද සහ ආරම්භ කරනු ලැබූ ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම්

අමාත්‍යාංශය විසින් මේ දක්වා රටවල් 10 ක් සමඟ අවබෝධතා ගිවිසුම් 12 ක් සඳහා අත්සන් තබා ඇත. නුදුරේදීම සාංගමික සංස්ථා පත්‍ර 02 ක් සඳහා අත්සන් තැබෙනු ඇත.

- සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය කැළණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, යාපනය විශ්ව විද්‍යාලය යන විශ්ව විද්‍යාල මඟින් ක්‍රියාත්මක කෙරේ. අදාළ පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් සඳහා තාක්ෂණික සහායය ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS) විසින් සපයා දෙනු ලැබේ. මෙම වැඩසටහන යටතේ ගම්පහ සහ ගම්පොල ප්‍රදේශයන්හි පාසල් තුනක සිසුන් 177 දෙනෙකු සඳහා දනුම්වත් කිරීමේ වැඩසටහන් තුනක් පවත්වනු ලැබිණි.

දීප ව්‍යාප්ත මට්ටමින් NAITA මධ්‍යස්ථාන 9 ක දී බඳවාගනු ලැබූ පුහුණු අපේක්ෂකයින් 136 දෙනෙකු සඳහා NVQ මට්ටම 4 වැඩසටහන් අඛණ්ඩව පවත්වන ලදී. හම්බන්තොට සූර්ය බල ශක්ති උද්‍යානයේදී NVQ අභ්‍යාසලාභීන් 84 දෙනෙකු සඳහා උසස් පුහුණු වැඩසටහන පවත්වනු ලැබිණි. ගාල්ල, රත්නපුර සහ මාතර NAITA මධ්‍යස්ථාන වලදී NVQ සූර්ය බලශක්ති කාර්මික ශිල්පීන්ගේ දෙවන කණ්ඩායම පුහුණු කිරීමේ වැඩසටහන ආරම්භ කරන ලදී. දෙසැම්බර් මස දී පුහුණු අපේක්ෂකයින් 76 දෙනෙකු සඳහා පූර්ව ඇගයුම් පවත්වන ලදී. NVQ වැඩසටහන ඇගැයීම සඳහා ඇගැයුම්කරුවන් පුහුණු කිරීම ආරම්භ කරන ලදී.

ව්‍යාපෘතිය විසින් පහත අංශ ආවරණය කරමින් ජාතික විද්‍යා සතිය සැමරීම සඳහා කැලණිය විශ්ව විද්‍යාලයේ දී වැඩසටහනක් පවත්වනු ලැබිණි.

- පුනර්ජනනීය බලශක්තියෙහි සහ සූර්ය බලශක්තියෙහි වැදගත්කම
- අපගේ විද්‍යාගාරයන්හි දී CdTe තුනී පටල සූර්ය කෝෂ තැනීම පිලිබඳ ඉදිරිපත් කිරීම
- ව්‍යාපෘතිය මඟින් තනනු ලැබූ විද්‍යාගාර මට්ටමේ සූර්ය කෝෂයක් පිලිබඳ සජීව ඉදිරිපත් කිරීම
- සූර්ය බලශක්තියෙ හි විවිධ ප්‍රයෝජන පිලිබඳ ප්‍රදර්ශනය කර පෙන්වීම

- සූර්ය බලශක්ති කාර්මික ශිල්පීන් පුහුණු කිරීමේ පළමු වැඩසටහනෙහි අභ්‍යාසලාභීන් වෙත පාඨමාලා අවසන් කිරීමේ ලිපි පිරිනැමීම

- පොහොර වර්ග වැඩි දියුණු කිරීම සහ පාංශු කළමනාකරණය හරහා නිසරු වූ බිම් සාරවත් භාවයට පත් කිරීම

මෙම වසරේ යල කන්නයේ දී කුරුණෑගල, අම්පාර සහ පොළොන්නරුව යන ප්‍රදේශවල අක්කර 55,000 ක භූමි ප්‍රමාණයක් සඳහා පේව පටල පේව පොහොර (BFBF) යෙදීම සිදු කල අතර, සෝයා බෝංචි වගා කළ අක්කර 8939 ක්, මුං ඇට වගා කළ අක්කර 5277 ක්, රටකජු වගා කළ අක්කර 250 ක් , ඇඹිලිය වගා කළ අක්කර 140 ක් සහ බෝංචි වගා කළ අක්කර 290ක් සඳහා මෙම කාල සීමාව තුලදීම රයිසෝබියම් පේව පොහොර (RBF) බෙදා හරින ලදී. 2021/ 2022 මහ කන්නය සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කරන ලදී. රජයේ කාබනික පොහොර වැඩසටහන යටතේ වී වගා කළ අක්කර 110,000 ක් සඳහා පේව පටල පේව පොහොර (BFBF) බෙදා දෙනු ලැබිණි.

රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන නොමිලේ පොහොර බෙදා දීමේ වැඩසටහන යටතේ ජාතික පොහොර ලේකම් කාර්යාලය සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DOA) සමඟ සහයෝගීතාවයෙන් වී වගාව සඳහා පේව පටල පේව පොහොර යෙදීම සඳහා පහසුකම් සපයා දීමේ ක්‍රියාවලියෙහි ජාතික මූලික අධ්‍යයන ආයතනය නියුක්තව සිටී.

- විද්‍යා ,තාක්ෂණ සහ නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය (COSTI)
  - ❖ බුද්ධිමය දේපළ (IP) සහ තාක්ෂණ පැවරුම් වැඩසටහන්

    විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයෙහි තාක්ෂණ නවෝත්පාදන සහායක මධ්‍යස්ථානය (TISC) විසින් දෘශ්‍ය සහ ප්‍රාසාංගික කලා විශ්ව විද්‍යාලයේ කාර්යමණ්ඩලය සඳහා බුද්ධිමය දේපල හිමිකම්, පේටන්ට් අවශ්‍යතා සහ ක්‍රියාවලි පිලිබඳ වෙබිනාර් සැසියක් පවත්වනු ලැබිණි. විශ්ව විද්‍යාලයීය ව්‍යාපාර සම්බන්ධතා ඒකකය විසින් මෙම සැසිය සංවිධානය කරනු ලැබිණි.

  - ❖ පේටන්ට් සෙවීම් සහ කෙටුම්පත්කරණය පිලිබඳ අතත්‍ය පුහුණු වැඩසටහන

    සී/ස හේලිස් ඩිජ්ඩි ප්‍රොඩක්ට්ස් (පෞද්) සමාගමෙහි පර්යේෂණ කණ්ඩායම සඳහා පේටන්ට් සෙවීම් සහ කෙටුම්පත්කරණය පිලිබඳ දින පහක අතත්‍ය පුහුණු වැඩසටහනක් විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයෙහි තාක්ෂණ නවෝත්පාදන සහායක මධ්‍යස්ථානය (TISC) විසින් පවත්වන ලදී. මෙහිදී සහභාගී වූවන් පේටන්ට් සෙවීමේ ශිල්පීය ක්‍රම, පේටන්ට් කෙටුම්පත්කරණ ක්‍රියාපටිපාටීන් සහ ක්‍රමෝපායන් පිලිබඳ පුහුණු කරනු ලැබිණි.

  - ❖ අපනයන සංවර්ධන මණ්ඩලයේ ජනාධිපති අපනයන සම්මාන යටතේ "වසරේ නවෝත්පාදක අපනයන නිෂ්පාදනය" ඇගයීමේ නිර්ණායක වැඩි දියුණු කිරීම (2018, 2019, 2020 සහ 2021 වසර සඳහා) සහ තේරීම් කමිටුවෙහි ඇගැයුම්කරුවන් ලෙස දායකත්වය දැක්වීම සිදු කරන ලදී.

  - ❖ EIE මාර්ගෝපදේශන වැඩසටහන 2021- EIE ව්‍යාපෘතිය යටතට ගැනෙන සහ EIE ව්‍යාපෘතිය යටතට නොගැනෙන ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලැබූ අතර ඊළඟ මාර්ගෝපදේශන වැඩසටහන සඳහා තාක්ෂණ 20 ක් ඉදිරිපත් කරනු ලැබිණි; පේටන්ට් භූ දර්ශන විශ්ලේෂණය සඳහා WIPO සහායය හඳුනාගත් තාක්ෂණ ක්ෂේත්‍රයන් පිලිබඳ පේටන්ට් භූ දර්ශන වාර්තා නිර්මාණය කිරීම සඳහා සාකච්ඡාවක් ආරම්භ කෙරිණි.

❖ ආයතනික බුද්ධිමය දේපළ ප්‍රතිපත්ති සංවර්ධන වැඩසටහන

ලෝක බුද්ධිමය දේපල සංවිධානය (WIPO) විසින් විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයේ සහයෝගීතාවය යටතේ Enabling Innovation Environment (EIE) ව්‍යාපෘතිය යටතට නොගැනෙන විශ්ව විද්‍යාල සහ ආයතන සඳහා වැඩසටහනක් දියත් කරන ලදී. ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය (KDU), යාපනය විශ්ව විද්‍යාලය, රබර් පර්යේෂණ ආයතනය (RRI), සහ පසු අස්වනු කළමනාකරණ ජාතික ආයතනය (NIPHM) යන ආයතන විසින් ප්‍රථම වරට මෙහි කොටස්කරුවන් වීම ඔවුන්ට හිමි වූ වරප්‍රසාදයක් ලෙස සලකන ලදී.

❖ KIPO/ KIPA උචිත තාක්ෂණ සංවර්ධන ව්‍යාපෘතිය 2021

කොරියානු නව නිපැයුම් ප්‍රවර්ධන සංගමය (KIPA) විසින් කොරියානු බුද්ධිමය දේපළ කාර්යාලයේ (KIPO) සහයෝගීතාවය යටතේ සංවර්ධනය වෙමින් පවතින රටවල තිරසර ආර්ථික වර්ධනය සඳහා පහසුකම් සලසා දෙනු පිණිස "උචිත තාක්ෂණය" නමි වූ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කෙරේ. කොරියානු රජයේ මූල්‍යමය සහ තාක්ෂණික සහායය යටතේ ග්‍රාමීය ප්‍රජාවන්හි ජීවන තත්ත්වය ඉහල නැංවීම අරමුණු කර ගනිමින් සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා උචිත තාක්ෂණයන් වැඩි දියුණු කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ ඉලක්ක කෙරේ.

ප්‍රජා ජල පවිත්‍රකරණ පද්ධති වැඩි දියුණු කිරීම යටතේ කාර්මික තාක්ෂණ ආයතනය (ITI) විසින් වැඩි දියුණු කරනු ලැබූ රතු මැටි පෙරීමේ තාක්ෂණය එක් කල ප්‍රති ආශ්‍රැති/අති පරිශ්‍රාවන පද්ධති තුනක්, පඩිකාරමඩුව, ගලෙන්බිඳුනුවැව සහ 679, හිඟුරුවැව ග්‍රාම නිලධාරී වසම යන ප්‍රදේශයන්හි ස්ථාපනය කරනු ලැබිණි. KIPA/ KIPO වෙතින් ලද අරමුදල් ව්‍යාපෘති සංවර්ධන කටයුතු සඳහා ජල සම්පාදන මණ්ඩලය සහ කාර්මික තාක්ෂණ ආයතනය වෙත වෙන් කර දෙනු ලැබිණි.

2021 වසරේ අවසාන කාර්තුවේදී ශ්‍රී ලංකාව වෙත පැමිණි කොරියානු නිලධාරීන්ගේ චාරිකාව අතරතුරදී ඉදිරි වසර තුනක කාලය සඳහා අවශ්‍ය කෙරෙන අමතර කොටස් COSTI සහ ජාතික ජලසම්පාදන මණ්ඩලය වෙත භාර දීම සිදු කෙරිණි.

- ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය

❖ විද්‍යාව ප්‍රචලිත කිරීමේ වැඩසටහන්

පාසල් සිසුන් මෙන්ම සාමාන්‍ය ජනතාව අතර තාරකා විද්‍යාව සහ අභ්‍යවකාශ විද්‍යාව ප්‍රචලිත කිරීමේ අරමුණින් පහත ක්‍රියාකාරකම් සිදු කෙරිණි.

ප්‍රචලිත කිරීමේ ක්‍රමය	**වැඩසටහන් සංඛ්‍යාව**	**ප්‍රතිලාභීන් සංඛ්‍යාව**
ග්‍රහලෝකාගාර දර්ශන	46	3,351
ඒළිමහන් වැඩසටහන්/ මාර්ගගත වෙබිනාර්	19	12,500
රූපවාහිනී වැඩසටහන්/ දැනුම්වත් කිරීමේ වැඩසටහන්	2	දීප ව්‍යාප්ත මට්ටමින්
Astro Kids & Astro IT classes	සතිපතා පන්ති 7	120

2.2. අනාගත අරමුණු

- වෘත්තීය පුහුණු ආයතනයන් හි සමස්ත ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් විවිධ පළාත් කේන්ද්‍ර කරගනිමින් "නිපුණතා උදාන 2022 " වැඩසටහන ආරම්භ කිරීමට නියමිත අතර ඒ අනුව පුහුණු ආයතනයන් හි භෞතික සහ විෂයමාලා සංවර්ධනය සැලසුම් කරනු ලැබිණි. මෙම වැඩසටහනෙහි පළමු පියවර වයඹ පලාතෙන් ආරම්භ කිරීමට නියමිතය.
- තෝරා ගනු ලැබූ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන් හි යටිතල සංවර්ධනය.
- වෘත්තීය අධ්‍යාපන ආයතනයන් හි උපදේශකවරුන් සඳහා නිපුනතා දීමනාවක් ගෙවීම් කිරීම.
- වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිසුන් සඳහා ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
- පර්යේෂණ ද්‍රව්‍ය ආනයනය කිරීමේ ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාව ඉහල නැංවීම උදෙසා හරිත නාලිකාවක් හඳුන්වා දීම.
- පර්යේෂණ සහ සංවර්ධන අංශයේ සිදු කෙරෙන පෞද්ගලික අංශයේ ආයෝජනයන් සඳහා ත්‍රිත්ව බදු අවම කිරීම් හඳුන්වා දීම.
- තෝරාගනු ලැබූ අධ්‍යාපන ආයතනයන්හි (විශ්වවිද්‍යාල, කාර්මික ආයතන, පාසල්) බීජෝෂණ පහසුකම් පුළුල් කිරීම.
- මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පුහුණු කිරීම් ඵලදායී අයුරින් සිදු කිරීම සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම.
- ජර්මානු රජයෙන් ප්‍රදානය කරනු ලැබූ රු. මිලියන 15.7 ක ප්‍රතිපාදන යටතේ මාතර ස්ථාපනය කෙරෙන ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වල ඉදිරි කටයුතු කර ගෙන යාම.
- ශ්‍රී ලංකා ජර්මානු කාර්මික විද්‍යාලය ස්ථාපනය කිරීම සඳහා ලංකා ජර්මානු කාර්මික පුහුණු ආයතන පනත සංශෝධනය කිරීම.
- IETI - කටුබැද්ද ව්‍යාපෘතියෙහි ගිවිසුම සඳහා ඉදිරි කටයුතු සලසුම් කරනු ලැබ ඇත.
- JAICA ස්වේච්ඡා වැඩසටහන යටතේ වෘත්තීය ආයතන සඳහා අවශ්‍ය ස්වේච්ඡා සේවා ලබා ගැනීම.
- කාර්මික අධ්‍යාපන සහ වෘත්තීය පුහුණු අංශය වැඩි දියුණු කිරීමේ අරමුණින් සෑම දිස්ත්‍රික්කයකම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ස්ථාපනය කිරීම.
- වෘත්තීය මාර්ගෝපදේශනයන් භාරව සිටින විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් දැනුම්වත් කිරීම හරහා පාසල්හි වෘත්තීය මාර්ගෝපදේශකත්ව කාර්යයන් විධිමත් කිරීම.
- නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය හරහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි වෘත්තීය මාර්ගෝපදේශන ක්‍රියාකාරකම් පුළුල් කිරීම.
- "සමෘද්ධිලාභී පවුල් 200,000 සවිබලගැන්වීම" වැඩසටහන යටතේ සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වල ළමුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති රාමුව සහ තිරසර සංවර්ධන ඉලක්ක හා අනුකූලත්වය දක්වන පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් සඳහා පහසුකම් සැපයීම.
- ගෝලීය නවෝත්පාදන දර්ශකයෙහි (GII) සහ ගෝලීය තරඟකාරීත්ව දර්ශකයෙහි (GCI) ඉහල ස්ථානයක් අත් කර ගැනීම.
- අති නවීන විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන පරිසර පද්ධති සහ පර්යේෂණ ආයතන වැඩි දියුණු කිරීම.
- පර්යේෂණ ආයතන/ කර්මාන්ත පර්යේෂණ සහයෝගීතාවන්, සංඛ්‍යාත්මකව ඉහල නැංවීම.
- රටෙහි පර්යේෂණ සහ සංවර්ධන ප්‍රගතිය සුපරීක්ෂණය සඳහා මනා ලෙස සංවිධිත යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම.

2.3. අභියෝග

- පර්යේෂණ සහ නවෝත්පාදන අංශය සඳහා ප්‍රමාණවත් පරිදි රාජ්‍ය අරමුදල් නොලැබීම
- රටෙහි පර්යේෂණ සහ සංවර්ධන අංශය සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය සහතික කිරීම උදෙසා යාවත්කාලීන කරන ලද ප්‍රතිපත්තීන් සහ උපායමාර්ග නොතිබීම
- පේටන්ට් බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලියේ ප්‍රමාද වීම්
- පර්යේෂණ වානිජකරණ ගැටලු
- රාජ්‍ය අංශයේ වැටුප් පරිමාණ හේතුවෙන් පර්යේෂණ ආයතනයන්හි වෘත්තිකයන් රඳවා ගැනීම හා සම්බන්ධිත ගැටලු
- විද්‍යාඥයන් සහ පර්යේෂකයන්ගේ බුද්ධි ගලනය
- දුර්වල කර්මාන්ත- විශ්ව විද්‍යාල - පර්යේෂණ ආයතන සහයෝගීතාවන්
- උපාධිධාරීන් සඳහා විද්‍යා හා තාක්ෂණ කර්මාන්ත (කුඩා පරිමාණ) ආරම්භය උදෙසා පවතින ව්‍යාපාර කුටීර/ ව්‍යාපාර ආරම්භයන්/ තාක්ෂණ උද්‍යාන / ව්‍යාපාර අවකාශ ප්‍රමාණවත් නොවීම
- ජාත්‍යන්තර සහයෝගීතාවන් ප්‍රමාණවත් නොවීම
- ගෝලීය වශයෙන් තරග කරනු පිණිස තරගකාරී පර්යේෂණ ප්‍රතිඵල ප්‍රමාණවත් නොවීම



පරිච්ඡේදය 03

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒඑස්ඒ-එෆ්

2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2021		සටහන	කණ්ඩායම 2021	කණ්ඩායම නැවත ඉදිපෙන ලද 2020	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒඑස්ඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අරමුදල්		2,253,696,328	3,036,934,739	ඒඑස්ඒ-3
-	කැන්පතු		95,089,307	68,298,457	ඒඑස්ඒ-4
-	අත්තිකාරම් ගිණුම්		27,594,361	62,122,440	ඒඑස්ඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		2,376,379,996	3,167,355,636	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		2,376,379,996	3,167,355,636	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		393,180	51,601,212	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		2,375,986,816	3,115,754,424	
	අඩුකළා : වියදම්				
-	ප්‍රතිසංවර්ධන වියදම්		-		
621,350,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	554,610,095	510,418,222	
229,400,000	අමුද්‍රව්‍ය හා භාණ්ඩ හා සේවා	6	149,422,143	172,685,557	ඒඑස්ඒ-2(ii)
6,192,815,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	5,010,959,318	5,273,552,280	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
7,043,565,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		5,714,991,556	5,956,656,060	
	මූලධන වියදම්				
1,024,760,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	645,141,068	107,666,400	
1,372,975,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	1,185,959,780	1,855,656,014	
1,054,500,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	573,990,477	638,345,120	ඒඑස්ඒ-2(ii)
10,000,000	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	5,846,132	86,248,460	
28,400,000	හැකියා වර්ධනය	14	15,261,378	155,931,280	
513,890,000	වෙනත් මූලධන වියදම්	15	307,289,146	1,235,101,309	
4,004,525,000	මුළු මූලධන වියදම් (උ)		2,733,487,980	4,078,948,582	
	කැන්පතු ගෙවීම්		11,195,368	20,786,074	ඒඑස්ඒ-4
	අත්තිකාරම් ගෙවීම්		26,323,360	12,375,672	ඒඑස්ඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්			-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		37,518,728	33,161,746	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		8,485,998,264	10,068,766,388	
11,048,090,000	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(6,110,011,448)	(6,953,011,964)	
	අරමුදල් සැපයුම් ප්‍රකාශය අනුව ශේෂය		(6,110,011,448)	(6,953,011,964)	ඒඑස්ඒ-7
	දෙසැම්බර් 31 දිනට අරමුදල් ශේෂය		-	-	ඒඑස්ඒ-3
			-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒඑසී-03

2021.12.31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2021	2020
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒඑසී-6	5,537,758,620	5,544,420,133
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒඑසී-5/5(ඒ)	71,326,302	72,597,303
මුදල් හා මුදල් සමාන දෑ	ඒඑසී-3	-	
මුළු වත්කම්		5,609,084,922	5,617,017,436
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(171,465,568)	(86,300,628)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		5,537,758,620	5,544,420,133
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒඑසී-5(බී)		-
ජංගම වගකීම්			
කැන්පතු ගිණුම්	ඒඑසී-4	242,791,870	158,897,931
අග්‍රිම ශේෂය	ඒඑසී-3	-	
මුළු වගකීම්		5,609,084,922	5,617,017,436

පිටු අංක 06 සිට 117 දක්වා ඒඑසී 1 සිට ඒඑසී 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් කොරතුරු සහ සටහන් පිටු අංක 118 සිට 137 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් කොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/~~ප්‍රධාන ගණකාධිකාරි~~/ ~~අධ්‍යක්ෂ (මුදල්)/ කොමිසාරිස් (මුදල්)~~
නම :	නම :	නම : කේ.වී.එස්. ද සිල්වා
තනතුර :	තනතුර :	
දිනය : 2022.02. 24	දිනය : 2022.02. 24	දිනය : 2022.02. 23

දීපා ලියනගේ
ලේකම්
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන,
පර්යේෂණ හා තව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

කේ. වී. එස්. ද සිල්වා
ප්‍රධාන මූල්‍ය නිලධාරි
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන,
පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය
"නිපුණතා පියස", 354/2, ගාල්ලපිටිය මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	නෝට්	නැවත ඇතුළත් කළ 2021 රු.	නැවත ඇතුළත් කළ 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
මුළු බදු ලැබීම්			-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර			-
ලාභ			-
ආදායම් නොවන ලැබීම්		25,299,767	14,169,723
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්		-	-
අග්‍රිම ලැබීම්		2,253,696,328	3,036,934,739
අත්තිකාරම් අයකර ගැනීම්		24,537,781	19,170,869
නැන්පතු ලැබීම්		95,089,307	68,298,432
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)		2,398,623,183	3,138,573,764
අඩුකළා : මුදල් වැය කිරීම්			
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්		694,935,218	635,510,925
සහනාධාර සහ මාරුකිරීම්		147,336,318	26,251,260
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරණ ලද වියදම්		4,930,020	81,250,369
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම්		393,180	51,601,212
අත්තිකාරම් ගෙවීම්		25,732,935	8,279,885
නැන්පතු ගෙවීම්		11,195,368	20,786,049
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)		884,523,040	823,679,700
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)		1,514,100,143	2,314,894,064
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
පොළී		-	-
ලාභාංශ		-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		-	-
උපණය අයකර ගැනීම්		-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		-	-
අඩුකළා : මුදල් වැය කිරීම්			
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්		1,514,100,143	2,314,894,064
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)		1,514,100,143	2,314,894,064
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)		(1,514,100,143)	(2,314,894,064)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		-	(0)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
දේශීය ණය ගැනීම්		-	-
විදේශීය ණය ගැනීම්		-	-
ප්‍රදානයන් ලැබීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)		-	-
අඩුකළා : මුදල් වැය කිරීම්			
දේශීය ණය ආපසු ගෙවීම්		-	-
විදේශීය ණය ආපසු ගෙවීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)		-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ම) = (උ) +(ඒ)		-	(0)
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		-	(0)

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන

වාර්තා කිරීමේ පදනම

1) වාර්තා කරන කාල පරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තා කරන කාල පරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙළ කර ඇති අතර සමහර වත්කම් වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැතිවිට ගිණුම් පිළියෙළ කිරීම වැඩිදියුණු කල මුදල් පදනම මත සිදු කරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) අදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාල සීමාව නොසලකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනා ගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනා ගනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

5) දේපල, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපල, පිරියත හා උපකරණාවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2021 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි වලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යය සාධනය

අදාළ නොවේ.

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්යය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	6,550,800,000	7,043,565,000	5,714,991,556	81%
ප්‍රාග්ධන	2,769,600,000	4,004,525,000	2,733,487,980	68%
එකතුව	**9,320,400,000**	**11,048,090,000**	**8,448,479,536**	**76%**

3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුව වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරනලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලදඅමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
1	අධ්‍යාපන අමාත්‍යාංශය	වසර 13 ක අධ්‍යාපනය සහතික කිරීම	2,926,775	2,926,775	2,926,775	100%
2	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	රාජ්‍ය සේවකයින්ගේ අත්තිකාරම් බී ගිණුමෙහි ශේෂය පියවීම	226,912	226,912	226,912	100%
3	රාජ්‍ය සේවා,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය	උපාධිලාභී පුහුණුලාභීන් සඳහා වැටුප්	1,776,333	1,776,333	1,776,333	100%
එකතුව			**4,930,020**	**4,930,020**	**4,930,020**	**100%**

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2021.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය වාර්තා කිරීම % ලෙස
9151	නේවාසික නොවන ගොඩනැගිලි	1,648,514,058	1,648,514,058		100%
9152	යන්ත්‍රෝපකරණ	1,232,126,422	1,232,126,422		100%
9153	ඉඩම්	1,494,318,140	1,494,318,140		100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-		-
9155	ජීවවිද්‍යාත්මක වත්කම්	-	-		-
9160	කෙරීගෙන යන වැඩ	1,162,800,000	1,162,800,000		100%
9180	බදු දෙන ලද වත්කම්	-	-		-

3.9 විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } විඃවි/ඒ/සමරසිංහිවි/ලේඛ්/2021

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2022 මැයි 31 දින

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | agg@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල යමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ආ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
බැරකම් ලේඛනය	මුදල් රෙගුලාසි 447(4) හා (5)	බැරකමට අදාල ඇණවුම්, ආදී ලියවිලි පිළිබඳ යොමුවක්ද ඇතුළුව එක් එක් මාසය අවසානයේ ඉතිරි බැරකම් හා විලම්භනය කරන ලද බැරකම්ද හඳුනාගත හැකි ආකාරයට බැරකම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

අමාත්‍යාංශයේ අරමුණු හා පරමාර්ථ ඉෂ්ඨ කරගැනීමේ අභිලාෂයෙන් සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුගත වෙමින් මුදල් රෙගුලාසි 50 කෙරෙහි අවධානය යොමු කර ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අවස්ථා පහත නිරීක්ෂණය විය.

(අ) පුනරාවර්තන වියදම

වාර්ෂික ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා තිබූ පුනරාවර්තන වැය විෂයයන් 08 ක් සඳහා වෙන්කල රු. 11,100,000 ක ප්‍රතිපාදනයෙන් කිසිදු මුදලක් උපයෝජනය කර නොතිබුණි.

(ආ) මූලධන වියදම

මූලධන වැය විෂයයන් 15 ක් සඳහා වෙන්කල රු. 63,400,000 ක් වූ ප්‍රතිපාදනයෙන් කිසිදු මුදලක් උපයෝජනය කර නොතිබුණි.

(ඇ) අධි ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයන්ට මාරු කරගැනීම

සැලසුම් සහගතව ප්‍රතිපාදන වෙන්කරවා නොගැනීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයන් 08 කට අදාළ රු. 16,502,944 ක අධි ප්‍රතිපාදන මුදලෙන් රු. 11,250,000 ක් හා මූලධන වැය විෂයයන් 20 කට අදාළ රු. 459,138,915 ක අධි ප්‍රතිපාදන මුදලෙන් රු. 374,581,000 ක් මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයන්ට මාරුකරගෙන තිබුණි. එය සියයට 25 සිට සියයට 100 ක් දක්වා පරාසයක පැවතුණි.

(ඈ) ඌන ප්‍රතිපාදන වෙනත් වැය විෂයන්ගෙන් ලබාගැනීම

නිසි සැලසුමකින් තොරව ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් වැය විෂයයන් 09 කට අදාළ රු. 327,656,000 ක් මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයන්ගෙන් ලබාගෙන තිබුණි. එය සියයට 28 සිට සියයට 100 ක් දක්වා පරාසයක පැවතුණි.

(ඉ) ප්‍රයෝජනයට නොගත් මුදල් රෙගුලාසි මාරු කිරීම

සැලසුමකින් තොරව මුදල් රෙගුලාසි 66 යටතේ මුදල් මාරු කිරීම හේතුවෙන් වැය විෂයයන් 05 කට අදාලව මුදල් රෙගුලාසි 66 මඟින් මාරු කරන ලද එකතුව රු. 14,916,000 ක මුදලින් රු. 1,958,354 ක්වූ මුදලක් ඉතිරි වී තිබූ අතර එය සියයට 19 සිට සියයට 40 දක්වා වූ පරාසයක විය.

2.2 අත්තිකාරම් ගිණුම් ශේෂ

ශීර්ෂ 421 විෂය අංක 42101 දරන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම "බී" ගිණුම පිළිබඳ පහත නිරීක්ෂණය කෙරේ.

නිලධාරීන් සේවය අතහැර යාම හා විශ්‍රාම යාම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු. 522,270 ක හිඟ ණය ශේෂ අයකරගෙන නොතිබූ අතර එම හිඟහිටි කාලය වසර 03 සිට වසර 21 දක්වා පරාසයක විය.

2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ගිණුම් වක්‍රලේඛ අංක 255/ 2017 ට අනුව සියළු බැරකම් ලේඛනගත කළයුතු වුවත් රු. 220,967 ක් වටිනා බැරකම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි.

(ආ). අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ ලබාදුන් රාජ්‍ය මුදල් වියදම් වූ ආකාරය සම්බන්ධයෙන් වගකීම අමාත්‍යාංශය වෙත පැවරෙන බැවින්, අමාත්‍යාංශය විසින් ඇති කරගත් බැඳීම් පරීක්ෂා කිරීම සඳහා මුදල් රෙගුලාසි 702(3) අනුව සේවා සැපයීම් හා ඉදිකිරීම් සම්බන්ධව පිළියෙල කල කොන්ත්‍රාත් ගිවිසුම්වල පිටපත් විගණනයට ඉදිරිපත් කලයුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුලදී ආරම්භ වූ වාත්තිය අධ්‍යාපන හා ප්‍රවර්ධන ආයතනවල භෞතික සම්පත් සංවර්ධනා වැඩසටහන යටතේ කාර්මික විද්‍යාල සංවර්ධනය සඳහා අවස්ථා 13 කට අදාලව ඇති කරගන්නා ලද කොන්ත්‍රාත් ගිවිසුම් වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 40,902,951 ක්වූ බැඳීම් ශේෂය තහවුරු කර ගැනීමට අදාල ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
i.	මුදල් රෙගුලාසි 214	මුදල් තිබෙන බවටත් නිතිපතා බිල් ලැබෙන බවටත් සහතික වීම පිණිස බලය දෙන නිලධාරීන් මෙන්ම සහතික කරන නිලධාරීන් විසින් බැරකම් පිළිබඳ ලේඛන නිතිපතා පරීක්ෂා කල යුතු වුවද විගණනයට ඉදිරිපත් කරන ලද බැරකම් ලේඛනය එලෙස පරීක්ෂා කිරීමට හැකිවන පරිදි සකස් කර නොතිබුණි.
ii.	මුදල් රෙගුලාසි 756,757 හා 1647 (ආ)	වාහන හා අමතර උපකරණ පිළිබඳව වාර්ෂික සමීක්ෂණ පැවැත්විය යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.
iii.	මුදල් රෙගුලාසි 1646	ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපතද සමග ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපතිවරයා වෙත යැවිය යුතු වුවත් අමාත්‍යාංශය සතු සංචිත වාහන 27 කින් වාහන 22 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ)	2015 ජූලි 14 දිනැති අංක 03/ 2015 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛය	අවස්ථා 19 කදී ලබාදී තිබූ ඉන්ධන හා විවිධ අත්තිකාරම් පියවීමේ ප්‍රමාදය මාස 01 සිට මාස 04 ක් දක්වා වූ කාල පරාසයක පැවතුණි. මේ තත්ත්වය මීට ඉහතදී පෙන්වා දී ඇතත් වර්තමානයේදීද නිවැරදි කරගෙන නොතිබුණි.
(ඇ)	2017 පෙබරවාරි මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කල ව්‍යාපෘති කළමනාකරණය සහ කොන්ත්‍රාත් කළමනාකරණය සඳහා මහ පෙන්වීම	මුදල් සපයන නියෝජිත ආයතනය මගින් පවත්වාගෙන යා යුතු ලේඛන හා ආකෘති සම්බන්ධව බාණ්ඩ අංක 2හි සඳහන් පරිදි ගෙවීම් ලේඛන හා වාර්තා (ආකෘති අංක CA33, CA34, CA 51, 53) අමාත්‍යාංශය පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ඈ)	2009 ජූනි 17 දිනැති අංක 09/ 2009 දරන රාජ්‍ය පරිපාලන වක්‍රලේඛය	අමාත්‍ය කාර්යමණ්ඩල, අමාත්‍යාංශ. ලේකම්වරුන්, ආයතන ප්‍රධානීන් ඇතුළුව සියළුම රාජ්‍ය සේවකයින් තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම් ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍රය මගින් සනාථ කල යුතු වුවද, අමාත්‍ය කාර්යමණ්ඩලයේ කිසිදු නිලධාරියෙකු උක්ත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එසේ පැමිණීම පිටවීම සනාථ කර ගැනීමකින් තොරව 2021 වර්ෂය තුල අදාල නිලධාරීන් වෙත රු. 9,212,498 ක මුදලක් වැටුප් සහ දීමනා ලෙස ගෙවා තිබුණි.
(ඉ)	2016 මාර්තු 29 දිනැති ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක උපණය (SEPI) යෝජනා ක්‍රමයේ II අදියර ගිවිසුම	II වැනි ගිණුම් වර්ෂය අවසන් වී තුන් මාසයක් ඇතුලත SEPI Loan Scheme – Phase 11 සම්බන්ධයෙන් ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමේ වගකීම මහ බැංකුව සතු වියයුතු වුවත් 2016 සිට මේ දක්වා එසේ කටයුතු කර නොතිබුණි.
i	3.2 ඡේදයේ වගන්තිය (f)	
ii.	ගිවිසුමේ 2.2 ඡේදයේ වගන්තිය (b)	ණය මුදල් ලබාදීම සම්බන්ධයෙන් අදාල වන සියළුම ඉල්ලුම්පත් අමාත්‍යාංශය හරහා ඉදිරිපත් කල යුතු වුවත්, එයට පටහැනිව 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ණය ලබාදෙන බැංකු විසින්ම එම ණයලාභීන් තෝරාගැනීම සිදුකර තිබුණි. ඒ අනුව ලියාපදිංචි කල ප්‍රතිලාභීන් 1,295 කින් ප්‍රතිලාභීන් 1,109 ක් වෙනුවෙන් රු. 491,134,875 ක ණය මුදලක් ලබාදී තිබුණු අතර ණය

ප්‍රදානය විගණිත දිනය දක්වාම එපරිදි ණය ලබාදෙන බව විගණනයේදී අනාවරණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතට අනුව ජාතික වෘත්තීය සුදුසුකම් සහිත (NVQ) පාඨමාලා පැවැත්වීම සඳහා පුහුණු පාඨමාලා ලියාපදිංචි කලයුතු අතර, උසස් තත්ත්වයෙන් යුතු දේශීයව හා ජාත්‍යන්තරව පිළිගත් අධ්‍යාපන හා පුහුණුව ලබාදීමට නම් එම පාඨමාලා ප්‍රතිනතය කිරීම අත්‍යාවශ්‍යය වේ. එහෙත් 2018 වර්ෂයේ සිට 2022 ජනවාරි 18 දින දක්වා අමාත්‍යාංශය යටතේ පැවති ආයතන වෙතින් ලැබී තිබූ අයදුම්පත් 343 ක් වාර්තාවේ දිනය දක්වා ප්‍රතිනතය සිදුකර නොමැති අතර, පෞද්ගලික අංශයේ ආයතන විසින් පවත්වනු ලබන පාඨමාලාවල ගුණාත්මකභාවය ඇති කිරීම සඳහා එම පාඨමාලා ප්‍රතිනතය කෙරෙහිද තිසි අවධානය යොමුකර නොතිබුණි.

(ආ) i. වෘත්තීය පුහුණුව ලද තරුණ ප්‍රජාවගේ ආර්ථික වර්ධනයට උරදීම සඳහා දායක කරගැනීම හා නිපුණතාවයෙන් සපිරි තරුණ බලකායට අත්වැලක් වීමට ගත් යෝජනාවක් ලෙස අදියර 02 ක් යටතේ ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක උපණය (SEPI) යෝජනා ක්‍රමය ආරම්භ කර ඒ යටතේ 2019 වර්ෂය තුල ණයලාභීන් 170 දෙනෙක් සඳහා රු. 76,241,000 ක ණය ලබාදී තිබුණි. එහෙත් 2020 වර්ෂයේ කිසිදු ණය ඉල්ලුම් පත්‍රයක් ලියාපදිංචි කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මෙම ණය ප්‍රදානය සඳහා රු. මිලියන 90 ක් ඇස්තමේන්තුගත කරතිබූ අතර, අමාත්‍යාංශය රජට ඉලක්කගත ප්‍රතිලාභීන් ගණනක් සෙවීම හා නිසි ණය මුදල් සැලසුමක් නොමැති වීම හේතුවෙන් වෙන්කරන ලද මුදලින් රු.මිලියන 80 ක් එනම් ශියයට 89 ක් වෙනත් වැය විෂයයකට මාරු කර තිබුණු අතර ණයලාභීන් තිදෙනෙක් පමණක් ලියාපදිංචි කර ඔවුන් වෙත රු. ලක්ෂ 05 බැගින් රු. මිලියන 1.5 ක් ලබා දී තිබුණි.

ii. ණය ගිවිසුම් ප්‍රකාරව ණය ලබාදිය හැක්කේ ස්වයං රැකියා ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූලික උපකරණ හා අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වුවද ශියයට 38 කට ආසන්න පිරිසක් ණය ලබාගෙන තිබුණේ ව්‍යාපාර පුළුල් කරගැනීම සඳහාත් ශියයට 14 කට ආසන්න ප්‍රතිශතයක් අදාල ණය මුදලෙන් කිසිදු

ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ ව්‍යාපාරයක් දිගටම පවත්වාගෙන යාමට හෝ ක්‍රියාකර නොතිබුණි. අමාත්‍යාංශයේ මැදිහත්වීම හා පසු විපරම් කටයුතු නිසි ආකාර අධීක්ෂණය යටතේ සිදු නොවූ හෙයින් මෙම ණය ලබා ගැනීමට බොහෝ කාලයක් ගතවීම, බැංකුව SEPI ණය කෙරෙහි අවධානය යොමු නොකිරීම හා ඒ පිළිබඳ දැනුවත්භාවය නොවීම මෙම ණය යෝජනා ක්‍රමයේ පොලී අනුපාතයට වඩා වැඩි පොලී අනුපාතයක් යටතේ ණය ලබාදීම වැනි කරුණු හේතුවෙන් ණය යෝජනා ක්‍රමයේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

3.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 ජනවාරි 04 දිනැති අංක 2209/14 දරන ගැසට් පත්‍රයේ සුවිශේෂී ප්‍රමුඛතා යටතේ හඳුනාගන්නා ලද නගර විශ්වවිද්‍යාල 05 ක් ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 100 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විට නගර විශ්වවිද්‍යාල 03 ක පමණක් මූලික ඉදිකිරීම් හා ඉඩම් පවරාගැනීම් කටයුතු පමණක් ආරම්භ කර තිබුණු අතර එහි මූල්‍ය ප්‍රගතිය සියයට 6.11 ක් විය.

(ආ) වෘත්තීය අධ්‍යාපනයට යොමුවන ශිෂ්‍ය සංඛ්‍යාව දෙගුණ කරමින් තරුණ ප්‍රජාව සඳහා වෘත්තීය ප්‍රහුණු අවස්ථා පුළුල් කිරීම අරමුණු කරගෙන වෘත්තීය පුහුණුවේ යෙදෙන සිසුන් සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැය යෝජනා යටතේ රු. මිලියන 500 ක ප්‍රතිපාදන මත සිසුන් 55,000 ක ශිෂ්‍යාධාර ක්‍රමයක් සඳහා ඉලක්ක කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විට ශිෂ්‍යාධාර ලබාදී තිබුණේ සිසුන් 26,730 කට පමණි. එම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 28 ක් විය.

3.1.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 ජුනි 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ආංශික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 434 කට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කින්නියා විශ්වවිද්‍යාල විද්‍යායතනයක් ස්ථාපිත කිරීමට ලැබුණු අනුමැතිය මත විශ්වවිද්‍යාලය සඳහා කාර්යමණ්ඩල නේවාසිකාගාරයක් ඉදිකිරීමට මූලික වියදම් ලෙස රු. 8,931,683 ක් 2019 වර්ෂයේදී වැයකර තිබුණද 2021 වසර සඳහා ප්‍රතිපාදන ලබා

ගැනීමට ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වැය කරන ලද එම මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ආ) 2017 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව කිලිනොච්චිය ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනයේ සිසුන් 400 දෙනෙකු සඳහා රු. මිලියන 300 ක සමස්ත පිරිවැයක් යටතේ ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදිකිරීමට අනුමත කර තිබුණි. යෝජිත ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේදී උපදේශක සේවා ගාස්තු ගෙවීම සඳහා රු. 6,028,015 ක් වියදම් දරා තිබුණද නිර්මාණය, කොන්ත්‍රාත් හා ඉදිකිරීමේ කළමනාකරණය සහ ඉදිකිරීම් හා පශ්චාත් ඉදිකිරීම් සුපරීක්ෂණය සඳහා උපදේශකයෙකු තෝරාගැනීම ප්‍රමාද වීමත් 2018 හා 2019 නිපුණතා ආංශික සංවර්ධන අංශයට වෙන් වූ මූල්‍ය ප්‍රතිපාදන සීමා වීමත්, ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීමත් මත ව්‍යාපෘතියේ වැඩ කටයුතු ප්‍රමාද වී තිබුණි.

(ඇ) 2017 වසරේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතිව 2018 වර්ෂයේ ආරම්භ කර එම වර්ෂය අවසාන වන විට නිම කිරීමේ අරමුණ ඇතිව රු. මිලියන 80 ක් පිරිවැය වූ සමාජයීය නවෝත්පාදන පරීක්ෂණාගාරයක් (Social Innovation Lab) ආරම්භ කිරීමේ යෝජනාව ඉදිරිපත් වී තිබුණි. ඒ සඳහා අමාත්‍යාංශ ලේකම් හා ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) අධ්‍යක්ෂ විසින් එකඟතාවයට පැමිණ අත්සන් තබා තිබුණි. එහි මෙහෙයුම් කටයුතු සඳහා වර්ෂ 2017 සිට 2018 දක්වා රු. මිලියන 35 ක් ලබාදී තිබුණි. මෙම එකඟතාවයන් 2020 දෙසැම්බර් 31 වන විට අවසන් වී ඇති අතර මේ සම්බන්ධයෙන් ඉදිරි වැඩ කටයුතු සඳහා මුදල් අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා ඇතත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට යෙදවූ රු. මිලියන 35 නිෂ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි.

3.1.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

(අ) I. 2016 පෙබරවාරි මාසයේදී ජාතික විද්‍යා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට ලබාදී තිබූ කැබිනට් මණ්ඩල අනුමැතිය මත අවශ්‍ය ඉඩම් කොටස පවරා ගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත රු. මිලියන 280 ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එහි අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේද DISCRIPTIVE TARGET යටතේ අවස්ථා 07 ක් ඉලක්ක කරමින් මධ්‍යස්ථානය ඉදිකිරීම් කටයුතු මාස 24 ක් තුල නිම කිරීමට රු. 2,819,711,538 ක ඇස්තමේන්තුගත මුදලකට යෝජනා වී තිබුණද එම ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

II. යෝජිත මධ්‍යස්ථානය ඉදිකිරීමේ ඉඩම වටා ආරක්ෂිත වැටක් ඉදිකිරීම සඳහා ජාතික ඉංජිනේරු, පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයෙන් රු. 7,837,061 ක ඇස්තමේන්තුවක් 2020 මාර්තු 05 දිනැති ලිපිය මඟින් අතිරේක ලේකම් (පර්යේෂණ) වෙත එවා තිබුණද එය අධ්‍යක්ෂ (විද්‍යා පර්යේෂණ හා සංවර්ධන) වෙත ඉදිරිපත් කිරීමට මාස 03 ක කාලයක් ප්‍රමාද වීම හේතුවෙන් අදාල කාර්යයන් ඉටුකර ගැනීම සඳහා අතුරු සම්මත ගිණුම යටතේ ලබාදුන් ප්‍රතිපාදන වෙනත් කාර්යයන් සඳහා යෙදවීමට සිදුවීමෙන් 2022 ජනවාරි මාසය දක්වාම වැටෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ආ) විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන හරහා 2030 දී සංවර්ධිත දේශයක් බවට පත් කිරීම දැක්ම කරගත් පර්යේෂණ හා නව නිපැයුම් අංශයට අදාලව විශේෂ ප්‍රමුඛතා ක්ෂේත්‍ර 06 ක් හඳුනාගෙන තිබූ අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ හඳුනාගත් ව්‍යාපෘති 05 ක් සඳහා රු. මිලියන 80 ක් වෙන් කරවා තිබුණද ඉන් අපේක්ෂිත අරමුණු කරා ළඟාවීම වෙනුවෙන් වැයකර තිබූ අතර එනම්, රු. මිලියන 7.68 ක් පමණක් එය සැලසුම් කරන ලද මුදලින් සියයට 9.6 ක් විය

3.2 අනාර්ථික ගනුදෙනු

2018 මැයි 22 දින අනතුරකට ලක්වූ කැබ් රථය අලුත්වැඩියා කර 2018 සැප්තැම්බර් 27 දින අමාත්‍යාංශය වෙත රැගෙනවිත් තිබුණද 2018 ඔක්තෝබර් 15 දින රියදුරුගේ ඉල්ලීම මත නැවත අලුත්වැඩියාවක් සඳහා ගරාජය වෙත යොමු කිරීමෙන් පසු සිදුකර රු. 51,500 ක් වැයකර 2021 ජනවාරි 12 දින රථය නැවත අමාත්‍යාංශය වෙත රැගෙන එන ලදී. ඒ අනුව මාස 27 කට ආසන්න කාලයක් සුළු අළුත්වැඩියා කටයුත්තක් සඳහා ගරාජයක් තුල නිෂ්කාර්යව පැවතුණි.

ඩබ්ලිව්.එම්.පී.ඒ.පොන්සේකා

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.

පිටපත: ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය (නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය)

04 පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක

4.1.1. කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

නිශ්චිත දර්ශක	සත්‍ය ප්‍රතිඵලය, අපේක්ෂිත ප්‍රතිඵලයෙහි ප්‍රතිශතයක්ලෙස(%)		
	100%-90%	75%-89%	50%-74%
වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම			√
වෘත්තීය අධ්‍යාපන අංශය සඳහා මූල්‍යමය ආයෝජනය		√	
විෂයමාලා සංවර්ධනය	√		
ජාතික නිපුණතා ප්‍රමිති	√		
ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය		√	
පිරිනමනු ලැබූ පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව	√		
ස්ථාපනය කර ගනු ලැබූ ඒකාබද්ධ පර්යේෂණ /පර්යේෂණ- කර්මාන්ත සහයෝගිත්වයන් සංඛ්‍යාව			√
දේශීය/ ජාත්‍යන්තර වශයෙන් ලබාගත් පේටන්ට් සංඛ්‍යාව			√
විද්‍යාව ප්‍රචලිත කිරීම හා අදාළව පවත්වනු ලැබූ වැඩසටහන් සංඛ්‍යාව	√		
ප්‍රකාශයට පත් කරනු ලැබූ ව්‍යවසායකත්වය මත පදනම් වූ පර්යේෂණ පත්‍රිකා			√
දේශීය/ ජාත්‍යන්තර වශයෙන් අත්සන් තබන ලද තාක්ෂණ පැවරුම් ගිවිසුම් සංඛ්‍යාව			√
දේශීය/ ජාත්‍යන්තර වශයෙන් වාණිජකරණය කරනු ලැබූ පර්යේෂණ නිෂ්පාදන සංඛ්‍යාව	√		
වාණිජකරණය සඳහා මූල්‍යමය සහායය ලබා දී ඇති නව නිපැයුම් සංඛ්‍යාව			√
විද්‍යාව ප්‍රචලිත කිරීම හා අදාළව ප්‍රකාශයට පත් කරනු ලැබූ විද්‍යාත්මක ප්‍රකාශන සංඛ්‍යාව	√		
කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වෙත තාක්ෂණය පවරා දීමේ වැඩසටහන් සංඛ්‍යාව	√		

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීම පිලිබඳ කාර්යසාධනය (SDG)

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න

අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා අත්කරගනු ලැබූ සාර්ථකත්වයෙහි ප්‍රගතිය		
			0-49	50-74	75-100
4. පරිපූර්ණ සහ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීම් අවස්ථාව සැලසීම	4.3 2030 වන විට සියලු කාන්තාවන් සහ පුරුෂයින්ට දැරිය හැකි මුදලකට ලබා ගත හැකි විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට සම අවස්ථා සහතික කිරීම	4.3.1 ස්ත්‍රී පුරුෂ භාවය අනුව පූර්ව මාස 12 තුල විධිමත් හා නොවිධිමත්අධ්‍යාපනය සඳහා යෞවනයන්ගේ සහ වැඩිහිටියන්ගේ සහභාගීත්ව අනුපාතය • ස්ත්‍රී බඳවාගැනීම් ප්‍රතිශතය • පුරුෂ බඳවාගැනීම් ප්‍රතිශතය • ශිෂ්‍ය බඳවා ගැනීම	√	√ √	
	4.4 2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික සහ වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහල නැංවීම	4.4.1 කුසලතාවයේ ආකාරය අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවෙන් යුක්ත යොවුන් සහ වැඩිහිටි ජනගහනයේ ප්‍රමාණය			√
	4.5 2030 වනවිට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීම, අධ්‍යාපනයේ සියලුම මට්ටම් වලට ප්‍රවේශ වීමේ අවස්ථාව තහවුරු කිරීම සහ ආබාධිත පුද්ගලයනට, ස්වදේශිකයන්ට සහ අවදානමට ලක් විය හැකි වෘත්තීය පුහුණුව ලබා ගැනීමට අවස්ථාව සැලසීම	4.5. සියලු අධ්‍යාපන දර්ශක සඳහා වන සමානාත්මතා දර්ශක වෙන්කොට දැක්විය හැක(ස්ත්‍රී/ පුරුෂ, ග්‍රාමීය/ නාගරික, ධනවත්භාවයේ මට්ටම යන පංචමකය සහ ආබාධිත මට්ටම, ස්වදේශික ජනයා සහ ගැටුම් බලපෑම් ආදී දත්ත පවත්නා බව අනුව) • අබාධිත ප්‍රතිශතය • ශිෂ්‍යත්ව ප්‍රතිලාභීන් ප්‍රතිශතය	√	√	
8 සුනිසි කාර්යයන් සහ ආර්ථික	8.2 විවිධාංගීකරණය, තාක්ෂණික වැඩි දියුණු කිරීම් සහ	8.2.1 එක් රැකියා නියුක්තිකයෙකුට සත්‍ය දළ දේශීය නිෂ්පාදිතයෙහි		√	

වර්ධනය	නවෝත්පාදනයන් හරහා ඉහල ආර්ථික ඵලදායීතා මට්ටමක් ළඟාකර ගැනීම	වාර්ෂික වර්ධන අනුපාතය			
9 සවිමත් යටිතලයන් ගොඩනැංවීම,අංගසම්පූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය, නවෝත්පාදනය පෝෂණය කිරීම	9.5 නවෝත්පාදන දිරිමත්කිරීම සහ මිලියන 1 ක ජනගහනයක් සඳහා සිටින පර්යේෂණ හා සංවර්ධන අංශයේ සේවකයන් සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ පර්යේෂණ වියදම් සැලකිය යුතු අන්දමින් ඉහල දැමීම හරහා 2030 වර්ෂය වනවිට, සංවර්ධනය වෙමින් පවතින රටවලට සුවිශේෂීව, සියලු රටවල්හි විද්‍යාත්මක පර්යේෂණ හා කාර්මික අංශයේ තාක්ෂණික හැකියාවන් ඉහල නැංවීම	9.5.1 පර්යේෂණ සහ සංවර්ධන වියදම්, දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයක් ලෙස			√
	9.b කාර්මික විවිධාංගීකරණය සහ පාරිභෝගික භාණ්ඩ සඳහා අගයන් එක කිරීම හරහා හිතකර ප්‍රතිපත්තිමය පරිසරයක් සහතික කරමින්, සංවර්ධනය වෙමින් පවතින රටවල දේශීය තාක්ෂණ සංවර්ධනය, පර්යේෂණ හා නවෝත්පාදන සඳහා සහායය ලබා දීම.	9.b.1 අගය එක් කල මධ්‍යම සහ අධි-තාක්ෂණික කර්මාන්ත නිෂ්පාදිතයන්, සමස්ත අගය එක්කල නිෂ්පාදිතයන්හි අනුපාතයක් ලෙස			√
17 අරමුණු උදෙසා සහයෝගිතාවයන්	17.6 විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන ක්ෂේත්‍රය වෙත ප්‍රවේශය සඳහා දැනුම බෙදා ගැනීම සහ සහයෝගිතාවය	17.6.1 සීමාසහිත වැසියන් 100 කට ස්ථාවර අන්තර්ජාල බ්‍රෝඩ්බෑන්ඩ් ග්‍රාහක සංඛ්‍යාව		√	

අභියෝග

- පසුගිය වසර කිහිපය තුළ පර්යේෂණ සහ සංවර්ධන අංශයේ ආයෝජනයන් සඳහා අඩු ප්‍රමුඛතාවයක් හිමි වීම.
- රාජ්‍ය ආයතන, නියාමකයින්, පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාල, ව්‍යාපාර, උපදේශන සමාගම් සහ වෘත්තීමය/ ව්‍යාපාර කණ්ඩායම්වලින් සැදුම්ලත් සක්‍රීය ජාලයක් නොපැවතීම.
- නිපුණතා සහිත මානව සම්පත් ප්‍රමාණවත් නොවීම.
- හිතකර පර්යේෂණ සහ නවෝත්පාදන පරිසර පද්ධතියක් නොතිබීම.
- රජයේ වේතන ක්‍රමවේදයේ ප්‍රතිඵලයක් ලෙස පර්යේෂණ ආයතන තුල වෘත්තිකයින් රඳවා තබා ගැනීමේ ගැටලු.
- විද්‍යාඥයින් සහ පර්යේෂකයින්ගේ බුද්ධි ගලනය.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	53	40	13
තෘතීයික	06	04	02
ද්විතියික	532	463	69
ප්‍රාථමික	78	63	15

6.2. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරනු ලැබූ නිලධාරීන් සංඛ්‍යාව	වැඩසටහනෙහි කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනෙහි ස්වභාවය (දේශීය /විදේශීය)	ප්‍රතිදානය / ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
වෘත්තීය මාර්ගෝපදේශනය පිලිබඳ ජාතික ඩිප්ලෝමාව (ශ්‍රී ලංකා පදනම් ආයතනය)	11	2021.01.01 - 2021.12.31 (මාස 12) සතිඅග පාඨමාලා	රු.660,000.00		දේශීය	අමාත්‍යාංශයේ ක්ෂේත්‍ර රාජකාරීන්හි නියුක්ත නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන්ගේ වෘත්තීය මාර්ගෝපදේශනය හා අදාළ දැනුම,කුසලතා සහ ආකල්ප වැඩිදියුණු කිරීම සහ ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය
මනෝවිද්‍යාත්මක උපදේශනය පිලිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (රුහුණ විශ්ව විද්‍යාලය)	03	2021.01.01 - 2021.12.31 (මාස 12) සතිඅග පාඨමාලා	රු. 180,000.00		දේශීය	අමාත්‍යාංශයේ ක්ෂේත්‍ර රාජකාරීන්හි නියුක්ත නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන්ගේ වෘත්තීය මාර්ගෝපදේශනය හා

						උපදේශනය හා අදාළ දැනුම, කුසලතා සහ ආකල්ප වැඩි දියුණු කිරීම සහ ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය
උපදේශනය පිලිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (කැලණිය විශ්ව විද්‍යාලය)	03	2021.01.01 - 2021.12.31 (මාස 12) සත අග පාඨමාලා	රු. 189,750.00		දේශීය	දේශීය අමාත්‍යාංශයේ ක්ෂේත්‍ර රාජකාරීන්හි නියුක්ත නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන්ගේ වෘත්තීය මාර්ගෝපදේශන ය හා උපදේශනය හා අදාළ දැනුම, කුසලතා සහ ආකල්ප වැඩි දියුණු කිරීම සහ ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය
උපදේශනය පිලිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (රුහුණ විශ්ව විද්‍යාලය)	01	2021.01.01 - 2021.12.31 (මාස 12) සතිඅග පාඨමාලා	රු. 60000.00		දේශීය	අමාත්‍යාංශයේ ක්ෂේත්‍ර රාජකාරීන්හි නියුක්ත නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන්ගේ වෘත්තීය මාර්ගෝපදේශන ය හා උපදේශනය හා අදාළ දැනුම, කුසලතා සහ ආකල්ප වැඩි දියුණු කිරීම සහ ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය
වෘත්තීය මාර්ගෝපදේශනය පිලිබඳ ජාතික ඩිප්ලෝමාව (ශ්‍රී ලංකා පදනම් ආයතනය)	02	2021.01.01 - 2021.12.31	රු. 120,000.00		දේශීය	අමාත්‍යාංශයේ ක්ෂේත්‍ර රාජකාරීන්හි නියුක්ත නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන්ගේ වෘත්තීය මාර්ගෝපදේශන ය හා උපදේශනය හා අදාළ දැනුම, කුසලතා සහ

						ආකල්ප වැඩි දියුණු කිරීම සහ ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය
ඉදිකිරීම් ව්‍යාපෘති කළමනාකරණය පිලිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන (MSc. වැඩසටහන) (මොරටුව විශ්ව විද්‍යාලය)	01	2021.02.01 - 2021. 12.31 සතියේ දින - සිකුරාදා	රු.400,000.00		දේශීය	වෘත්තීය ධාරිතා සංවර්ධනය
ලිපි ගොනු සහ රාජකාරී ලිපි සැකසීම	83	2021.12.22 (දින 01)	රු . 7540.00		දේශීය	අමාත්‍යාංශයීය නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය
මූල්‍ය ආර්ථික විද්‍යාව පිලිබඳ උපාධිය - 2021 (කොළඹ විශ්ව විද්‍යාලය	01	2021 -2022	රු . 192,000.00		දේශීය	වෘත්තීය ධාරිතා සංවර්ධනය
මානව සම්පත් කළමනාකරණය පිලිබඳ උපාධිය (MHRM) (කොළඹ විශ්ව විද්‍යාලය)	01	2021- 2022	රු . 310,000.00		දේශීය	වෘත්තීය ධාරිතා සංවර්ධනය
රාජ්‍ය ප්‍රසම්පාදන සහ වත්කම් කළමනාකරණය පිලිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව (සී/ස දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රය) (DLC)	01	2021.09.29. -2021.12.15	රු . 30000.00		දේශීය	වෘත්තීය ධාරිතා සංවර්ධනය
මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව වැඩසටහන(JDS) ව්‍යාපෘතිය ,මෙයිජි ,ටෝකියෝ විශ්ව විද්‍යාලය,ජපානය	01	2021.09.20 - 2023.10.31 (වසර 02)		අමෙරිකානු ඩොලර් 600 ස්ටර්ලින් පවුම් 75		වෘත්තීය ධාරිතා සංවර්ධනය

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංක	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වීම /අනුකූල නොවීම)	අනුකූල නොමවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනාගතයේදී අනනුකූලතාවන් වළක්වා ගැනීමට යෝජනා කරන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මුල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබීම**			
1.1	වාර්ෂික මුල්‍ය ප්‍රකාශ	අනුකූලත්වය දක්වා ඇත		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූලත්වය දක්වා ඇත		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වානිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්			
02	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/ 2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ් පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		

2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
2.11	උප පත්‍රිකා පොත්ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ .135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ පවරාදී තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය දැනුවත් කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදි තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
3.4	2014.05.11 දිනැති අංක 171/ 2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන් පාලනයන්ට යටත්ව කටයුතු කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
4.3	1971 අංක 38 දරණ මූල්‍ය චක්‍රලේඛය අනුව අදාළ වර්ෂය සඳහා අයවැය අනුමත කර තිබීම			
4.4	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
4.5	වාරිෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
4.6	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
4.7	කාර්තුමය වාර්තා භාණ්ඩාගාරය වෙත අදාළ නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූලත්වය දක්වා ඇත		

06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134 (2)) ඇඒ/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ජා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
6.2	සියලු අභ්‍යන්තර විගණන වාර්තා සඳහා මසක් ඇතුලත පිළිතුරු සපයා තිබීම.	අනුකූලත්වය දක්වා ඇත		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනත් 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාරතා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම	අනුකූලත්වය දක්වා නොමැත	කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කළමනාකරණ කමිටු රැස්වීම් 2 ක් පමණක් පවත්වා ඇත.	අවම වශයෙන් විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවත්වීමට කටයුතු කෙරෙනු ඇත
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදි ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
8.2	A ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/ 2016 අනුව භාණ්ඩ සමීක්ෂණය පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූලත්වය දක්වා ඇත	.	
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 ට අනුව සිදුකිරීම	අනුකූලත්වය දක්වා ඇත		

09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූලත්වය දක්වා නොමැත	කමිටුව පත් කරන ලද නමුත් කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකි විය	නව කමිටුවක් පත් කිරීමට සැලසුම් කර ඇත
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා දැ යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ .103 ,104,109,හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
9.5	2016.12.29 දිනැති අංක 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූලත්වය දක්වා නොමැත	කොවිඩ් වසංගතය නිසා ඉන්ධන පරීක්ෂාව සිදු නොකරන ලදී	ඉන්ධන පරීක්ෂාව සඳහා පළමු සතිය තුළ කමිටුව පත් කිරීමට සැලසුම් කර ඇත
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, කල් බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාළ නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		

11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම අනුකූලත්වය දක්වා ඇත	අනුකූලත්වය දක්වා ඇත		
11.2	මු.ලර.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට ඵළඹීම	අනුකූලත්වය දක්වා ඇත		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූලත්වය දක්වා ඇත		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම අනුකූලත්වය දක්වා ඇත	අනුකූලත්වය දක්වා ඇත		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම අනුකූලත්වය දක්වා ඇත	අනුකූලත්වය දක්වා ඇත		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
14.2	මු.රෙ .371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
14.3	මු.රෙ .371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූලත්වය දක්වා ඇත		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ.		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර ඇත	අනුකූලත්වය දක්වා ඇත		

15.3	මු.රෙ .176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර දක්වා ඇත තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත සේවක සංඛ්‍යාව තුල කාර්ය මණ්ඩලය සඳහා ගෙවීම් කර තිබීම අනුකූලත්වය දක්වා ඇත	අනුකූලත්වය දක්වා ඇත		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
16.3	අංක.04/2017 සහ 2017.09.20 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය අනුව සියලු වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලත්වය දක්වා ඇත		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දි තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චොදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතෙහි 08 සහ 10 වගන්තීන් අනුව ද්වි වාර්ෂික සහ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරනු ලැබ ඇත.	අනුකූලත්වය දක්වා ඇත		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/ 2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	19.1 2018 .01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/ 2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගනිමින් මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
19.2	19.2 කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූලත්වය දක්වා ඇත		

19.3	ඉහත කී චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දක්වා ඇති ආකෘතිය පදනම් කර ගනිමින් සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූලත්වය දක්වා ඇත		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූලත්වය දක්වා ඇත		